# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ උඳුවප් අව අටවක පෝදා 2022 දෙසැම්බර් 16 සිකුරාදා BUDUSARANA FRIDAY DECEEMBER 16, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 26 පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13



අම්බ ජාතක කතාව ඇසුරිනි



# කර්මය නම් කුමක්ද?

**අපේ ක්‍රියාවනට අනුකූලව ක්‍රියාත්මක වන, පුද්ගලයකුගේ බලපෑමක් නැති, ස්වභාවික න්‍යායක් ලෙස කර්මය හැඳින්විය හැකි ය. එය නීති දායකයකු නොමැතිව නීතියක් නොහොත් ධර්මතාවක් ලෙසින් පවතින්නකි. කර්මය ක්‍රියාත්මක වන්නේ එයට ම ආවේණික වූ ක්ෂේත්‍රයක ය.**

බාලයකු සරල බසින් කර්මය කුමක්දැයි මෙසේ දක්වනු ඇත.

එනම්, හොඳක් කරන්න. ඒ හොඳ ඔබට දැන් හෝ පසුව හෝ ලැබේ.

නරකක් කරන්න. එම නරක දැන් හෝ පසුව හෝ ඔබට ලැබේ.

අස්වනු නෙළන බසින් දක්වතොත් කර්මය මෙසේ පැහැදිලි කළ හැකි ය. ඔබ හොඳ බීජ වැපුරුවොත් හොඳ අස්වැන්නක් ඔබට ලැබේ. නරක් වූ බීජ වැපුරුවොත් නරක අස්වැන්නක් නෙළා ගත හැකි ය.

විද්‍යානුකූල බසින් කර්මය යනු හේතු ප්‍රත්‍ය න්‍යාය ලෙස දැක්විය හැකි ය. සෑම හේතුවකටම ප්‍රතිඵලයක් ඇත.

ධම්මපදයේ කර්මය විස්තර වන්නේ මේ ආකාරයෙනි.

සියලු හොඳ හෝ නරක අවස්ථාවන්හි දී මනස පෙරටුව සිටියි. ඔබ අයහපත් හෝ යහපත් මනසකින් කථා කරයි ද, ක්‍රියා කරයි ද, එවිට අයහපත හෝ අයහපත ඔබ පසුපස එන්නේ රියෙහි බැඳි ගවයා ගේ පසුපස යන රිය සක ලෙස ය. නැතහොත් ඔබ අත හැර නො යන ඔබේ සෙවණැල්ල මෙනි.

කර්මය සරල වශයෙන් ක්‍රියාවකි. පණ ඇති ජීවියකු තුළ පවතින ශක්තිය නොහොත් බලය නොයෙක් නම්වලින් හැඳින්වෙයි. එනම් මූලික ආශා හෙවත් ලැදිකම්, විඥානය ආදී වශයෙනි. එවැනි සහජ ගති ලක්ෂණ සෑම ජීවියකු ම චලනය කරයි. ඒ ජීවියා මනෝගතව හෝ භෞතික වශයෙන් චලිත වේ. ඒ චලිතය ක්‍රියාව නම් වෙයි.

ක්‍රියාවන් නැවත නැවත සිදුවීමෙන් පුරුදු ඇති වෙයි. පුරුදු හැසිරීම් හෙවත් චර්යාව බිහි කරයි. බුදු සමයේ දී මේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කර්මය යන නමිනි.

අවසාන අරුතින් කර්මය යන්නෙන් අදහස් කරන්නේ හොඳ හෝ නරක මානසික ක්‍රියාවන් හෙවත් චේතනා ය. කර්මය චේතනාවකි'යි බුදුරජාණන් වහන්සේ දෙසූ සේක. මේ අනුව කර්මය ඒකකයක් නොවේ. ක්‍රියා පිළිවෙළකි. ක්‍රියාවකි, ශක්තියකි. බලවේගයකි.

සමහරු මේ බලවේගය හඳුන්වන්නේ ක්‍රියාකාරී බලය යනුවෙනි. අප වෙත එන ප්‍රතික්‍රියාවන් අප කරන ක්‍රියා නිසා ඇතිවන ඒවා ය. මිනිසා ප්‍රත්‍යක්ෂණය කරන වේදනා හා සතුට ඔහුගේ ම ක්‍රියාවල ප්‍රතිඵලයකි. ඔහුගේ ම වචන හා සිතිවිලි ඔහු වෙත ම ප්‍රතිචාරය වීමකි. අපේ ක්‍රියා, වචන හා සිතිවිලි අපේ සමෘද්ධිය හා පරාජය, වාසනාව හා අවාසනාව නිෂ්පාදනය කෙරේ.

පොදු ස්වභාවික න්‍යායක් වන කර්මය ක්‍රියාත්මක වන්නේ අපේ ක්‍රියාකාරකම්වලට සම්පූර්ණ අනුකූලතාව අනුවයි. එය ඊට ම පොදු වූ නීතියක් මිස නීති දායකයකු නොමැත.

කර්මය ක්‍රියාත්මක වන්නේ එයට අයත් ක්ෂේත්‍රයේ ම ය. එයට බැහැරින් මැදිහත් වන ස්වාධීන පාලන නියෝජනයක් නොමැත. හොඳ හෝ නරක විපාක දෙන අධීක්ෂකයකු හෝ පරිපාලකයකු නොමැත්තේ ය. බෞද්ධයෝ කර්මානුකූල ප්‍රතිඵල අපේක්ෂාවෙන් ද දෙවියන් යැදීම කෙරෙහි විශ්වාසය නො තබති. බුදුරදුන්ගේ ධර්මයට අනුව කර්මය යනු වෙනත් කිසිදු පිළිසරණක් නොමැති බැවින් අපගේ ආයාචනය පරිදි කිසියම් අද්භූත බලවේගයන් විසින් අප වෙත පමුණුවනු ලැබූ බාහිර තීරකවාදී මායාවක් හෝ දෙවියන් විසින් මෙසේ වියයුතු යැයි කරනු ලැබූ නියමයක් ද නොවේ.

බෞද්ධයන් විශ්වාස කරන්නේ මිනිසා බිජුවට වැපිරූ අයුරු අස්වනු නෙළා ගන්නා බවයි. අප සිටියේ කෙසේද? යන ප්‍රශ්නයට පිළිතුරු ලෙස අපි දැන් පෙනී සිටිමු. වෙනත් වචනවලින් කිවහොත් මිනිසා කෙසේ සිටියේ ද? ඒ අයුරින් දිගට ම නිරපේක්ෂ ලෙස පෙනී සිටින්නෙක් නොවේ. මෙයින් සරල ලෙස අදහස් කරන්නේ කර්මය කලින් තීරණය කරන ලද බලවේගයක් නොවන බවයි.

බුදුරදුන් පෙන්වා දුන් පරිදි සෑම දෙයක් ම වෙනස් විය යුතු ය. අපි අපේ අතීතයේ වහලුන් බවට නිකම්ම පත් වෙමු. අනික් අතට සෑම දෙයක් ම තීරණය කර නොමැති නම් ආදර්ශ වගා කිරීම හා ආධ්‍යාත්මික වර්ධනයක් නොමැත්තේ ය. ඒ නිසා බුදුරජාණන් වහන්සේ බාහිර තීරක වාදය හෝ අතීරක වාදය නො පිළිගත් සේක.

කර්මය පිළිබඳ වැරැදි අර්ථකථනයන් හා අතාර්කික මත ගැන අංගුත්තර නිකායේ සඳහන් වේ. නුවණැත්තන් ඒ ගැන පරීක්ෂා කොට පහත සඳහන් මත අත්හැර දැමීම නුවණට හුරු ය. සියල්ල පූර්ව ජාතියේ කළ ක්‍රියාවන්ගේ ප්‍රතිඵල යැයි විශ්වාස කිරීම, උත්තරීතර පාලකයකු ගේ නිර්මාණයන්හි විපාක යැයි ඇදහීම හා සියල්ල පැන නඟිනුයේ හේතුවක් හෝ ඵලයක් නොමැතිව යන විශ්වාසය.

පුද්ගලයකු මිනීමරුවකු, හොරකු, ස්ත්‍රී දූෂකයකු වීමත්, ඔහුගේ ක්‍රියාවන් පූර්ව ක්‍රියාවන් නිසා ඇති වූවක් සේ ද,

උත්තරීතර පාලකයකු ගේ නිපදවීමක් හේතුකොට සිදුවන්නක් ද, ඒ ඒ අවස්ථාව අනුව නිකම් සිදුවූවක් ද වේ නම් ඒ පුද්ගලයාගේ අයහපත් ක්‍රියාවලට ඔහු වගකිව යුත්තකු සේ සැලකිය නො හැකි ය.

කර්මය පිළිබඳ තවත් සදොස් අදහසක් මෙසේ දැක්වේ. කර්මය ක්‍රියාත්මක වන්නේ යම් පුද්ගලයකු විශ්වාස කරනු ලබන ඔහුගේ ඇදහිල්ල අනුව ය. මිනිසාගේ ඊළඟ ජීවිතය පිළිබඳ ඉරණම ඔහු තෝරාගත් විශේෂ ආගම මත යන්තමින් හෝ රඳා පවතී යැයි සිතිය නො හැකි ය. ඔහු අදහන ආගම කුමක් වුව ද මිනිසා ගේ ඉරණම මුළුමනින් ම රඳා පවත්නේ ඔහුගේ කයින්, වචනයෙන් සිතිවිල්ලෙන් කරන ක්‍රියාවන් මත ය. ඔහුට කවර අඩයාලමක් තිබුණ ද, යහපත් ක්‍රියාවන්ගෙන් පිරි නොකිලිටි ජීවිතයක් ගත කරයි නම්, ඊළඟ ජීවිතයේ හෝ වාසනාවත් ජීවිතයකට හිමිකම් ලබයි.

තම සිතෙහි දුෂ්ට සිතිවිලි රඳවා ගනිමින්, පාප ක්‍රියාවන්හි යෙදෙමින් ජීවත් වන මිනිසාගේ ඊළඟ ජීවිතය ද කාලකණ්ණි තත්ත්වයට පත්වේ.

බෞද්ධයෝ මරණින් පසු සුගතිගාමී වීමට වාසනාව ඇත්තේ තමනට පමණකැයි කිසිවිටෙකත් නො කියති. කවර ආගමක් ඇදහුව ද මිනිසා ගේ කර්මානුකූල සිතිවිලි ඔහුගේ ඉරණම තීරණය කරනු ඇත.

බුදුරජාණන් වහන්සේ කර්ම න්‍යාය දේශනා කළේ ධනවතුන් ආරක්ෂා කිරීමට හෝ දුප්පතුන් සැනසීමටවත්, ඊළඟ ජීවිතයේ දී උරුම වන වාසනා මහිමය පිළිබඳ මනෝදර්ශකයක් දැක්වීමටවත් නොවේ. බුදු සමයට අනුව කර්මය පැහැදිලි කරන්නේ මනුෂ්‍ය වර්ගයා අතර පවතින අසමානතාව යි. මේ විෂමතා ජන්මය, පරිසරය, ස්වභාවධර්මය මෙන් ම කර්මය හෙවත් අපේ ම ක්‍රියාවන් නිසා වූවකි.

ඇත්ත වශයෙන් අපේ ජීවිතයේ ජයග්‍රහණයට හෝ පරාජයට වගකිවයුතු සාධකයන්ගෙන් කර්මය ද එකකි. කර්මය අදිසි බලවේගයක් බැවින් එහි ක්‍රියාකාරිත්වය මසැසින් දකිනු බැරි ය. කර්මය ක්‍රියාත්මක වන අයුරු අවබෝධ කර ගැනීමට නම් බිජුවටට හා සැසඳිය යුතු ය.

කර්මයේ ප්‍රතිඵල අපේ උප විඥානයේ හෙවත් භවාංග චිත්තියෙහි තැන්පත් වී ඇත. ඒ කෙසේද යත්, කිසියම් වී ඇටයක් තුළ ඉන් හටගන්නා ශාඛයේ කඳ, අතු, කොළ, මල්, ගෙඩි ඇතුළත් වන්නා සේ ය. යෝග්‍ය තත්ත්වයන් තුළ කර්මය ද ඵල දරයි. එනම් තෙතමනය හා ආලෝකය සමඟ කුඩා බීජය පැළ වී දළු රිකිලි දමා කඳ කොළ අතු පතර සැදෙන්නා සේ ය.

කර්මයේ ක්‍රියාකාරීත්වය බැංකු ගිණුමක් හා සැසඳිය හැකි ය. මේ ජීවිතයේ දී සත්පුරුෂයා පින්වතෙකි. ත්‍යාගශීලියෙකි. ඒ තැනැත්තා ඔහු ගේ යහපත් කර්මයට තව තවත් එකතු කරයි. මෙසේ ලබාගත් යහපත් කර්මය හේතුකොටගෙන කරදර රහිත ජීවිතයක් කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය.

නමුත් ඔහු ගත් දේ නැවත තැන්පත් නොකළහොත් ඔහුගේ ගිණුම හීන වී බංකොලොත් වේ. ඔහුගේ එවන් දුක්ඛිත තත්ත්වයට වරදකරු වන්නෝ කවුරු ද? දොස් පැවරිය හැක්කේ කාට ද? අනුන්ට හෝ තමාගේ ඉරණමට දොස් පැවරිය නොහැකි ය. ඔහුම එයට වගකිව යුතු ය.

මේ අනුව යහපත් බෞද්ධයකුට පලායන්නකු හෝ, ඇඟ බේරාගන්නකු හෝ නො විය හැකි ය. කර්මානුකූල බලවේගය අකර්මණ්‍ය වීමෙන් පාලනය කළ නොහැක්කේ ය. වීර්යවත් යහපත් ක්‍රියාකාරකම් කෙනකුගේ වාසනාව සඳහා නැතුව ම බැරි දෙයකි. පලායෑම දුර්වලයා ගේ සිරිතකි. එසේ පලායන්නහුට "කර්ම න්‍යායේ විපාකයන්ගෙන් ගැලවෙනු පිණිස සැඟවීමට තැනක් නැත්තේ ය."

**කේ. ශ්‍රී ධම්මානන්ද හිමි**

# දුසිරිතට වැට බැඳ සුසිරිතට මඟ සදමු

**සියලු සත්වයෝ සැප විඳීමට කැමැති ය. දුක් විඳීමට අකැමැති ය. එය මෙලොව පරලොව දෙලොවට ම අදාළ ය. ආර්ථික සංවර්ධනය තිබුණ පමණින් පූර්ණ ජීවිත සංවර්ධනයක් ඇති නොවේ. ඒ සඳහා ආධ්‍යාත්මික සංවර්ධනයක් ද තිබිය යුතු ය. එකී සංවර්ධනය උදකර ගැනීමට බුදුසමය සියලු ලෝ වැසියන්ට නිවැරැදි, නිරවුල් මඟ පෙන්වීමක් ලබා දෙයි.**

සියලු ලෝ වාසීන්ගේ මෙලොව හිත සුව පිණිස පවතින කරුණු හතරකි. එනම්,

## උට්ඨාන සම්පද

ධනයත්, බුද්ධියත් දෙක ලබා ගැනීම සඳහා කරන කටයුතුවල දී අව්ව, වැස්ස, රැය, දාවල, සීතල, උණුසුම, ආහාර අනුභව කළ වේලාව, බඩගිනි වේලාව ආදි කිසිවක් නොසැලකිය යුතු ය.ධනය වැඩියෙන් ලබා ගත හැකි කුමන වේලාවේ වුව වැඩ කිරීමටත්, බුද්ධිය වැඩිපුර ලබා ගත හැකි කුමන වේලාවේ වුව ඒ කාර්යයෙහි යෙදීමටත් පෙළ ඹිය යුතු ය. කලට වේලාවට, ඇසුරු කරන පුද්ගලයාට සුදුසු පරිදි සිතා මතා අවස්ථාවෝචිත ලෙස අනලස්ව කටයුතු කිරීම කළ යුතු ය.

## ආරක්ඛ සම්පද

උත්සාහයෙන් රැස්කර ගත් ධනය හෝ බුද්ධිය නැති වී යා නොදී රැක ගැනීමයි. විවිධ ව්‍යාපාර මඟින්, රැකියා මඟින් රැස් කළ ධනයත්, පාසල් යාමෙන්, ගුරු ඇසුරින්, බණදහම් ඇසීමෙන් , පතපොත කියවීමෙන්, වැඩිහිටියන් උගතුන් හා සාකච්ඡා කිරීමෙන්, රටතොට ඇවිදීමෙන් ලබා ගත් බුද්ධිමය ධනයත්, විනාශ වීමට ගතවනුයේ සුළු වේලාවකි. රජුන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන්, වතුරෙන්, වේයන්, මීයන් කෑමෙන්, සුරාවෙන්, සූදුවෙන්, බේබදුකමෙන්, සල්ලාලකමෙන් උපයන ධනය නැති වෙයි.

උගත් ධර්මය, ශිල්පය, ශාස්ත්‍රය අභ්‍යාසයෙහි නොයෙදීමෙන්, අමතකව යාමෙන්, අභාවිතයෙන් නැතිවී යා හැකියි. කවරාකාරයකින්වත් උපයා ගත් ධනය, ලබා ගත් දැනුම බුද්ධිය නැති වී යා නොදී රැක ගැනීමෙහි පමණක් නොව, ඒවා වැඩි දියුණු කර ආරක්ෂා කර ගැනීමෙහි කාර්යශීලිව දූරදර්ශීව, අවස්ථාවෝචිත ව, ඉවසිලිවන්තව, සිහිනුවණින් යෙදී කටයුතු කොට එකී ධනයත්, බුද්ධියත් දියුණු කොට, සංවර්ධනය කොට තහවුරුව තබා ගැනීමට දන්නා බවයි.

## කල්‍යාණ මිත්තතා

හොඳ විනයක් ඇති, සැදැහැවත්, ත්‍යාගවත්, නැණවත් තමන්ට වඩා ගුණධර්මවලින් දියුණු සුරාවෙන් සූදුවෙන් සල්ලාලකමින් චරිතය කිලිටි කර නොගත්, මඟ නොමඟ නිවැරැදි ව පෙන්වා දීමෙහි සමත් කාරුණික පුද්ගලයා ධනවතකු නොවූව ද කල්‍යාණ මිත්‍රයෙකි. එබඳු තැනැත්තා ධන, නිල ආදියෙනුත් යුක්තනම් පරිපූර්ණ කල්‍යාණ මිත්‍රයෙක් වන්නේ ය.

එබඳු ඇසුරින් තමාගේ ගුණධර්ම වැඩි දියුණු වේ.

## සමජීවිකතා

තමන්ගේ ආදායමට සරිලන පරිද්දෙන් වියදම් කිරීමට දන්නා බවයි. ආදායමට ඔරොත්තු නොදෙන අයුරින් ගේ දොර, ආහාරපාන, ඇඳුම් පැළඳුම් ආදී බොරු ආටෝප වැඩිකර ගන්නට යාමෙන් රටට ණය ගැතියෙක් වීමට සිදුවේ. වර්ණවත් ණය ගැති ජීවිතයට වඩා චාම් වූ ද, පිරිසුදු වූ ද ණය නැති නිදහස් ජීවිතය සැපත හා සහනය පිණිස වන්නේ ය. ස්වකීය ආදායම සතර කොටසකට බෙදා එක කොටසක් එදිනෙදා පරිභෝගය සඳහා යෙදීම ද, කොටස් දෙකක් ධනෝපාර්ජනය සඳහා වූ ව්‍යාපාරික කටයුතු සඳහා යෙදීම ද, සතරවැනි කොටස ආපදාවක දී ගැනීම සඳහා තැන්පත් කොට තැබීම ද බෞද්ධ ආර්ථික උපදේශය වන අතර, මෙසේ දැන ක්‍රියා කිරීම සමජීවිකතාව වන්නේ ය.

ධනය ඉපැයීම අමාරු ය. ඒ සඳහා දැඩි වෙහෙසක් ගත යුතුයි. නමුත් ධනය වියදම් කිරීම ඉතා පහසු ය. ඒ සඳහා බොහෝ මාර්ග ද තිබේ. ලෝකයේ වසන සියලු පුද්ගලයන්ගේ ධන භෝග සම්පත් විනාශයට බලපාන හේතු හතරක් තිබේ. සල්ලාලකම, බේබදුකම, සූදුව හා පාප මිත්‍රයන් ඇසුර යි. මෙම කරුණුවලට අමතරව අලසකම තවත් ප්‍රධාන හේතුවකි.

පරලොව හිත සුව පිණිස දියුණු කළ යුතු ගුණධර්ම හතරක් ද තිබේ.

## සද්ධා සම්පද

තෙරුවන් කෙරෙහි පැහැදීම හා විශ්වාසය ද, කර්ම කර්මඵල කෙරෙහි විශ්වාසය ද ශ්‍රද්ධාව ලෙස සැලකිය හැකි ය. ශ්‍රද්ධාව ඇති තැනැත්තා තෙරුවන් කෙරෙහි ප්‍රසාදයෙන් ගුණදහම් දියුණු කරන අතර, කර්මඵල විශ්වාසය තුළින් කායික වැරැදි, වාචසික වැරැදි නොකරයි. සිතිවිලි ද පිරිසුදු කර ගැනීමට වෙර දරයි. එනිසාම ඔහුගේ පැවැත්ම පරලොව හිතසුව පිණිස ම වන්නේ ය.

## සීල සම්පද

දස කුසලයන්හි යෙදෙමින් ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන්, චතුර්විධ වාග් දුශ්චරිතයෙන් වැළකී සිටීම සීල සම්පත්තිය යි. සිල්වත් අයට පරලොව යහපතම මිස අයහපතක් නම් නොවන්නේ ය.

## චාග සම්පද

නැති බැරි අයට තමන් හරිහම්බ කරගත් ධනයෙන්, වස්තුවෙන්, මෙන් ම ශ්‍රමයෙන් වේවා, වචනයකින් වේවා සැනසීම සඳහා පරිත්‍යාගයක් කිරීමට ඉදිරිපත් වීමයි.

## ප්‍රඥා සම්පද

සංස්කාර ධර්මයන්ගේ යථා ස්වභාවය දන්නා නුවණ ප්‍රඥාව යි. අනිත්‍ය, දුක්ඛ,අනාත්ම හෙවත් හේතුන් නිසා හටගත් සියලු ධර්මයන්ගේ වෙනස්වීමත්, වෙනස්වීම ඇති තැන පවත්නා දුකත්. වෙනස්වීම හා දුක පවත්නා දෙය තමන්ගේ අභිමතය පරිදි නොපවත්නා බැවින් "මම" ය "මාගේ" යැයි කිව නොහැකි අනාත්මතාවත් යන මේ ත්‍රිලක්ෂණය වැටහෙන නුවණ ඇති බව ප්‍රඥාව යි. ප්‍රඥාව ඇති තැනැත්තා අගතිගාමී වීම ආදී වශයෙන් පරලොවින් පරාජිත නොවේ.

මෙම ගුණධර්ම දියුණු කිරීම පුද්ගලයාගේ මෙලොව පරලොව හිතසුව පිණිස වන්නේ ය. ස්ත්‍රියක් වේවා පුරුෂයකු වේවා, ලොව කොතැනක වාසය කරන, කවර ජාතියකට වේවා, කුලයකට වේවා ආගමකට වේවා, රටකට වේවා, අයත් පුද්ගලයාට දියුණුවක් මිස පිරිහීමක් නොවන්නේ ය. ලාබය පිණිස, වාසය පිණිස, සැපත පිණිසම මෙම කරුණු උපකාර වන්නේ ය.

තමන්ගේ දියුණුව රඳා ඇත්තේ තමන් අත ම ය. එය අන් අයට කළ හැකි නොවේ. තමාට තමා ම හැර අන් කවරකුවත් පිහිට නොවේ. තමා හිසට තම අතමය සෙවණැල්ල යනුවෙන් සඳහන් වන්නේ ද එය ම ය.

අනුන්ගේ අඩුපාඩු හොඳ නරක නොසොයා තමන්ගේ යහගුණ දියුණු කර ගනිමින් දුසිරිතෙන් ඈත්ව ක්‍රියාකිරීමෙන් මෙලොව, පරලොව යහපත උදාකර ගත හැක. ඒ සඳහා අප්‍රමාදීව වීර්යයෙන් අනලස්ව ක්‍රියා කළ යුතු ය. එබඳු මඟ පෙන්වන දහමක උරුමකම් ලද්දෝ අපි වෙමු. එම දහම නම් මීට අවුරුදු දෙදහස් හයසියයකට පෙර දේශනා කොට වදාළ ශ්‍රී සම්බුද්ධ ධර්මය යි.

දඩල්ල වාලුකාරාම විහාරයේ
ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**



# දෙව් සැපයම සෙවූ පතිපූජිකා

අපගේ බුදුරජාණන් වහන්සේ වැඩ වසන කාලයේ සැවැත්නුවර එක්තරා නිවසක ළදැරියක් උපන්නා ය. ඇයට පෙර ආත්මය කියන්නට හැකියාවක් පහළ විය. ඇගේ පෙර ආත්මයේ තව්තිසා දෙව්ලොව මාලභාරී දෙවියන්ගේ දහසක් දෙවඟනන් අතර එක් දෙවඟනක් වූවා ය. මෙම මාලභාරී දෙවියන් දහසක් දෙවඟනන් පිරිවරාගෙන මල් නෙළන්නට උයනට පිවිසියේ ය. එක් දෙවඟනක් ආයු කාලය අවසන්ව පෙර පින් අවසන් වී ගිය බැවින් එම මල් උයනේ දී ම චුතව මෙසේ මිනිස් ලොව උපත ලැබුවා ය.

ඇය මිනිස් ලොව උපත ලැබ වැඩිවියට පත්ව පින්දහම් කර මාලභාරී දෙවියන්ගේ දෙවඟනක් හැටියට උපත ලබන්නට පැතුවා ය. ඇය පතිපූජිකා යනුවෙන් ප්‍රසිද්ධ වූවා ය.

පතිපූජිකාව නිතර නිතර මහා සංඝයා වහන්සේට උපස්ථාන කරන්නට විහාරස්ථානයට ගොස් දන් පිළියෙළ කිරීම, මල් පිළියෙළ කිරීම, පැන් පිළියෙළ කිරීම සිදු කළා ය. මෙම පින්කම් කරන්නට ඇයට සැමියාගේ ආධාර සහ අනුබලය නොඅඩුව ලැබුණි.

එම යුවලට පුත්තු සිව් දෙනෙක් සිටියහ. මනුලොව වසර 50කට පසුව පතිපූජිකාව රෝගාතුරව මියගොස් ඇය කරන ලද පැතුම අනුව තව්තිසා දෙව්ලොව මාලාභාරී දෙවියන්ගේ දෙවඟනක් ලෙස යළි උපත ලැබීය. ඇය මිනිස් ලොව ළදැරිය ලෙස උපත ලැබ වැඩිවිය පැමිණ විවාහ වී දරුවන් ලබා මියගොස් යළි තව්තිසා දෙව්ලොව දෙවඟනක් ව උපත ලැබීය.

මිනිස් ලොව අවුරුදු සියයක් දෙව්ලොව එක් දිනයකි. පතිපූජිකාව මිනිස් ලොව ගත කළ කාලය දෙව්ලොවට ඇසිල්ලක් පමණක් විය. ඒ නිසා දෙව්ලොව කාලයෙන් ඉතා සුළු මොහොතක දී ඇගේ චුතවීම සහ යළි ඉපදීම සිදු වූ බැවින් සෙසු දෙවඟනන්ට ඇයගේ ඉපදීම හා චුතවීම ගැන හැඟීමක් නො වීය.

උපස්ථානයෙහි ලැදිව සිටි පතිපූජිකාවගේ අභාවය ගැන බුදුරදුන්ට සැලවිය. එය නිමිති කරගෙන පස්කම්හි ඉතා ගිජුව ඇලුන මිනිසා එහි සෑහීමට පත් නොවී මරු වසඟයට යන්නේ ය යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක.



**කළුවච්චිමුල්ලේ ධම්මරක්ඛිත හිමි**

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## උඳුවප් අව අටවක 2022-12-16

# සිත හඳුනාගනිමු

සිත අපූර්වතම බලවේගයකි. ජීවිතයක් තීරණය වන්නේ ඒ බලවේගය ක්‍රියාත්මක වන ආකාරය අනුව ය. වෙනත් විදියකින් කියනවා නම් කෙනෙක් ජීවිතය ජය ගන්නේත්, පරාජයන් ලබන්නේත් සිතේ ක්‍රියාකාරිත්වයට අනුව ය.

සම්බුදු දහම අපට උගන්වන්නේ ජීවිතය පරාජය වීමට නොවේ. ජය ගැනීමට ය. එහෙදී ජය ලබනු පිණිස සිත හදා ගන්නා ආකාරය අපට පැහැදිලි කර දෙයි. එනම් අපවිත්‍ර නොකර, පිරිසුදු කර ගන්නා අයුරු උගන්වයි. එහෙත් බෞද්ධ යන නාමයට ගැනෙන බොහෝ දෙනෙක් එසේ සිත සාදා ගන්නා ආකාරයක් නම් නොපෙනේ.

දුක් පීඩා, මානසික කඩාවැටීම්, ගැටලු හා ප්‍රශ්න, වියවුල්, අඬදබර, කෝලාහල ආදි ලෙස පුද්ගල තත්ත්වයේ සිට අප ජීවත්වන පොදු සමාජය දක්වාත්, පරිසරය තුළත් ඇතිවන ගැටලු මිනිසා සිත සාදා නො ගැනීමේ ප්‍රතිඵල ය.

අප සෑම මොහොතකම උත්සාහ කළ යුතු දහම් දැනුම පොතට හෝ, දැනුමට හෝ, වචනයට හෝ සීමා කිරීමට නොවේ. ක්‍රියාවට නැඟීමට ය. ඒ ගැන අනුන්ට අවවාද අනුශාසනා දීම පමණක් ද ප්‍රමාණවත් නැත. එය තමන්ගෙන් ඇරඹිය යුත්තකි. එවිට තමන් අනුව යන දරුවන් ආදි තම සමීපතමයන් ද ඒ අනුව යනු ඇත. එවිට සමාජය හදන්නට අමුතුවෙන් මහන්සි විය යුතු ද නැත.

පරාජයන් ලැබෙන්නේ අපිරිසුදු සිත නිසා බව පෙර සඳහන් විය. සිත අපවිත්‍ර වන්නේ පාපකාරී සිතිවිලිවලින් හා කෙලෙස් සිතිවිලිවලිනි. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, අසීමිත තණ්හාව, ලෝභය ආදි සිතිවිලි පාපකාරී සිතිවිලිවලට අයත් ය. නිවැරැදි වන්නට ඒ හඳුනා ගැනීම අත්‍යවශ්‍යය.

බොහෝ දෙනෙක් තුළ අඩු වැඩි වශයෙන් පවතින වෛරී සිත ගැන බලමු. වෛරය විනාශකාරී වේ. තමන්ගේ ජීවිතය පමණක් නොව ඊට අදාළ කර ගන්නා අන් අයගේ ද ජීවිත වෛරී ගින්න නිසා දැවී හළු වන්නේ ය. එවන් තත්ත්වයක් තුළ පරාජය ම මිස දිනුමක් කෙසේ අපේක්ෂා කරන්න ද? එහෙයින් ඒ අපිරිසුදු සිතිවිල්ල ටිකෙන් ටික හෝ දුරු කරන්නට වෑයම් කළ යුතු ය.

වෛරී සහගත සිතිවිලිවල ඇරඹුම කිසියම් පුද්ගලයකු ගැන හෝ කිසියම් ක්‍රියාවක් ගැන හෝ සිතේ ඇතිවන විරුද්ධ ස්වභාවය යි. එසේ නැතිනම්, අප්‍රිය ස්වභාවයයි. එවැනි සිතිවිල්ලක සිට ක්‍රියාත්මක වන විට කිසිම දෙයක හරි වැරැද්ද පෙනෙන්නේ නැත. එය හරියට උණුකර නටවන ලද වතුර භාජනයක් තුළින් මුහුණ බැලුවහොත් එහි නියම තත්ත්වය දැකීම දුෂ්කර වන්නා සේ ය.

සිත ගැන හොඳ අවබෝධයකින් සිටිනවා නම් සිතේ වෙනස්කම් හඳුනා ගැනීම අපහසු නැත. තමන්ගේ සිතට අනුන් ගැන තරහක්, ද්වේෂයක් දැනෙන හැම මොහොතකම ඒ ගැන සැලකිලිමත් ව එය දුරු කර ගැනීමට තමන් ම සිතට බල කළ යුතු ය.

අපේ ශරීරය, එසේත් නැතිනම් වස්ත්‍රයක් අපිරිසුදු වූයේ නම් අපි වහා ම එය සෝදා පවිත්‍රකර ගනිමු. ඒ සඳහා භාවිත කරන්නේ පිරිසුදු ජලයයි. අපිරිසුදු සිත ද පිරිසුදු කළ යුතු ය. වෛරය නිසා සිත අපවිත්‍ර වූයේ නම් මෛත්‍රිය නමැති සිසිල් ජලයෙනි එය සෝදාහළ යුත්තේ.

ලෝකයට අවංකව ම මෙත් වැඩිය හැකි වන්නේ තමන්ට මෙත් වඩන පුද්ගලයාට ය. ඔහු කිසිදු සිතිවිල්ලකින් හෝ ක්‍රියාවකින් හෝ තමන්ට හානියක් කර ගන්නේ නැත. වෛරය ද එවැනි විනාශකාරී සිතිවිල්ලක් නිසා ඔහු එය දැනෙන සැණින් වහා සෝදා හරී. එවිට අපිරිසුදු සිත ක්‍රමයෙන් පිරිසුදු වී පරාජයන් වෙනුවට ජයග්‍රහණය කරා ඔහු ගෙන යයි.

අනෙකුත් කෙලෙස් සිතිවිලි ද මෙසේ ම දැනෙන මොහොතේ ම පිරිසුදු කර ගන්නට වෑයම් කළ යුතු ය. බෞද්ධයින් ලෙස අපට අපේ සිත ප්‍රභාෂ්වර කර ගත හැකි එවිට ය.

# සිත සරසන අබරණ ජීවිතයම බබළවයි

**සැවැත්නුවර දෙවුරම් වෙහෙරවාසී ලකුණ්ටක භද්දිය තෙරණුවෝ බොහෝ ගුණවත් ය. ලද දෙයින් සතුටු ව කල් ගෙවති. උන්වහන්සේ පෙර අත්භවයෙහි ද අනේක විධ පින්කම්වල නියැළුණහ.**

එසේ වුව ද යම් යම් පින්කම්වල දී සිදුකළ වංචාසහගත ක්‍රියාවන් ද විය.

පෙර ආත්ම භවයක එක් පුද්ගලයෙක් තම වියදමෙන් ඉතා උසස් ආකාරයේ පින්කමක් සූදානම් කළේ ය. එය මහා පින්කමකි. එහෙත් මෙම පුද්ගලයා ඒ පින්කමට වැයවන වියදම ඉතා අඩු කොට පින්කම සුළුවෙන් කරවිය. ඒ හේතු කොට මේ අත්භවයෙහි ඉතා මිටි, කුඩා සිරුරක් හිමිව උපන්නේ ය. පැවිදි වූ පසු හිමියන් දකින අනෙක් පිරිස් සිතුවේ කුඩා නමක් ලෙසිනි. පින්කම කුඩාවට කරවීම හේතු කොට මිටි ජීවිතයක් ලැබුණත්, ගුණ යහපත් බවින් උන්වහන්සේ බොහෝ උසස් වූහ.

ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ රහත්භාවයට පත්ව සිටියහ. එහෙත් මේ තෙරුන් රහත් යැයි කිසිවකුත් දැන නොසිටියහ. එබැවින් විහාරයේ වැඩ සිටින හෙරණ වහන්සේ එකතුව ඇතැම්විට කවටකම් කරති. තවත් විටෙක කන්පෙත්තෙන් පවා අදිමින් කවටකම් කරති. විහාරයෙහි නියමිත වතාවත් නිමකොට විවේකීව කාලය ගත කරන අවස්ථාවන්හි දී කුඩා වහන්දෑ මේ තෙරුන් වහන්සේගේ කන අල්ලාගෙන "කිමෙක්" ද කුඩා පියාණනි. මේ සසුනෙහි කළකිරීම් නැද්දැ'යි අසති.

ලකුණ්ටකභද්දිය තෙරුන් වහන්සේ බොළඳ අයගේ කෙළිකවටකම් යැයි ඉවසති. කෙතරම් කෙලිකවටකම් කළ ද ඔහු බණින්නේ ද නැත. තරහ ගන්නේ ද නැත. කවුරු මොනවා කීවත් නෙළුම් පතෙහි දිය නොරැදෙන්නා සේ තෙරුන් වහන්සේගේ සිතේ ද නොරැදෙන්නේ ය.

**සෙලො යථා එකඝනො**
**වාතෙන න සමීර ති**
**එවං නින්දා පසංසාසු**
**න සමිඤ්ජන්ති පණ්ඩිතා**

ගල්පව්වක් යම් සේ සුළඟින් නොසැලේ ද, එසේම නුවණැත්තෝ නිගාවෙහි ද, පැසසුම් හි ද නො සැලෙති.

ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ මේ කෙළිකවටකම් නො සලකා, ඉවසන අයුරු පුදුම යැයි දම් සභාවේ කතාවක් ඇතිවිය. ඒ අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ මේ කරුණ නිමිති කොට මෙසේ දේශනා කරන සේක.

"හාත්පසින් ම ඝන වූ ගල් පවුරක් යම් සේ සිව්දිගින් හමන සුළඟින් නො සැලෙන්නේ ද, එසේ ම නුවණැති අය නින්දා, ප්‍රශංසා දෙකෙහි ම නොසැලෙන්නේ ය.

එනම් අන්‍යයන්ගෙන් තමන් කරා පැමිණෙන ඇණුම්, බැනුම්, විහිළු කිරීම්, නිගා කිරීම් හෝ ගුණ වැයීම්, ගරු බුහුමන් කිරීම් පැසසුමකට හෝ උරණවීමකට, උඩඟුවීමකට නොපැමිණ සෑම දෙයක් ම මැදහත් ව දරුවන් නොසැලී, නිසලව සිටිනා බව දේශනා කළ සේක.

> පෙර ආත්ම භවයක එක් පුද්ගලයෙක් තම වියදමෙන් ඉතා උසස් ආකාරයේ පින්කමක් සූදනම් කළේ ය. එය මහා පින්කමකි. එහෙත් මෙම පුද්ගලයා ඒ පින්කමට වැයවන වියදම ඉතා අඩු කොට පින්කම සුළුවෙන් කරවීය. ඒ හේතු කොට මේ අත්භවයෙහි ඉතා මිටි, කුඩා සිරුරක් හිමිව උපන්නේ ය.

අපට ද මේ සමාජයේ ජීවත්වීමේ දී එනම්, රැකියාව, පාසල, පොදු ස්ථාන ප්‍රවාහනය හෝ නොයෙක් අවස්ථාවන් හි දී විහිළු - තහළු, ඇණුම් - බැණුම්, නින්දා - ප්‍රශංසා, නිගා කිරීම්, ගුණ වැයීම්, ගරු - බුහුමන් ලැබීම් සිදුවේ. ඒ අවස්ථාවේ තමන්ගේ සිතට දුකක් හෝ සතුටක් ඇති වේ ද, ඒ කිසිදු අවස්ථාවක උරණවීමකට හෝ උඩඟුවීමකට පත් නොවිය යුතු ය.

ඒ ඒ අවස්ථානුකූලව ඔබ මැදහත් සිතින් නොසැලී සිටීමට වග බලාගත යුතු ය. එය නුවණැතියන්ගේ ලක්ෂණයකි.

ඔබත් නුවණැතියෙක් සේ මේ සමාජයේ හැසිරෙන්නට වග බලා ගන්න. එය මේ පෘථග්ජන සමාජයේ ජීවත්වීමේ දී වඩා වැදගත් වේවි. එපමණක් නොවෙයි. නන්විධ ආභරණීන් ගත නොසැරසුවත්, මේ අපූර්ව ගතිගුණ ඔබ බබළන ආභරණ බවට පත් වනු ඇත.

දීපා පෙරේරා



# පින්සරු කාන්තා රත්නයක රුව සොබා

**සිදුහත් කුමරුගේ අභිමතාර්ථයන් සාධනය කරමින් යශෝධරාවෝ සාකල්‍යයෙන්ම කරුණා බර ප්‍රියම්බිකාවක් වූවා ය. ලොව යථාර්ථය මැනවින් දත් සිදුහත් යශෝධරා යුවළ සම ප්‍රඥාවෙන්, සම ත්‍යාගයෙන් සෙනෙහසින් බැඳී දයාවෙන් කල් ගෙවූහ. විමුක්තිය පිණිස වූ කතිකාවත දෙදෙනා අතර වූයේ බොහෝ කල් පටන් ය.**



උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ
**මොරටුවේ ආනන්ද හිමි**

තවුස් දම් පුරන්නට තමන් තුළ වූ අභිලාෂය සිදුහත් බෝසතාණෝ වරෙක යශෝධරාවට නොවළහා හෙළි කළහ. ඔබ තපසට යන්නේ නම් මා ද ඔබ සමඟ තපස් රකිමි"යි එවිට යශෝධරාව සපථ කළා ය.

සියුමැලි කතකට එවැනි දුක් ගැහැට අනුභවය උගහට ය. මා විමුක්ති රසය වළඳා ලෝකෝත්තර ශාන්තිය ඔබට ද දානය කරන්නෙමි'යි එදා සිදුහත් කුමාරයාණෝ පිය බිරිඳ රිදුණු හද සැනසුවෝ ය.

සුදොවුන් පිය රජුත්, ප්‍රජාපතී සුළු මවුත් ඔබ රැකවරණයට සිටිත් යැයි පවසා පිය බිරිඳ සිත අස්වසා සිදුහත් කුමරු තම අභිමථාර්ථ සාධනයෙහිලා උත්සුක වූහ.

ඇසළ සඳ නැගි පුන් පොහෝ දින මානව ශිෂ්ටාචාරයේ කිසිදු පුරුෂයකු, කිසිදු රජකු සිදු නොකළ ආකාරයෙන් රම්‍ය ප්‍රාසාද, ප්‍රිය ප්‍රියම්බිකාව, රන්කැටි පුත්රුවන හැරපියා බුදු බව උදෙසා සිදුහත් මහ බෝසත්හු අනුපිය අරණේ හුදකලාව බවුන් වඩන්නට වූහ.

මහ බෝසත්හු සම්බුද්ධත්වයට පත්ව, දම්සක් පවත්වා, එළැඹි වෙසක් පුන් පෝහෝ දා ස්වකීය ජාතභූමිය වූ කිඹුල්වතයට සම්ප්‍රාප්ත වූ සේක්' නෑසියන් දැක, පිය මහරජුන් සමඟ යශෝධරා රාජ දේවි පාසාදයට වැඩම කළෝ ය. සුදොවුන් මහ රජාණෝ ස්වකීය ලේලිය වූ යශෝධරාවන් ගැන කළ ගුණ වැනුම ලෝ වැසි ජගත් කාන්තා සංහතියට ම මහඟු ආදර්ශයකි.

"ස්වාමීනි, මගේ දූ යශෝධරාවෝ ඔබ වහන්සේ කසාවත හඳින බැව් අසා කසාවතින් සැරසුණා ය. සිත්කලු වස්ත්‍රාභරණ හැර දැම්මා ය. එක් වේලක් වළඳනු අසා ඇය ද එක වේලක් ම වැළඳුවා ය. ඔබ මඟම ගනිමින් උස් අසුන්, මහ අසුන් හැරදැම්මා ය. මල්ගඳ විලවුන් අත්හැරියා ය. ඇය අතපතා කොතෙක් කුමාරවරු හසුන්පත් එවූව ද ඒ හැම ඇය පිළිකුලෙන් බැහැර කළා ය." යනුවෙන් පවසත්ම බුදුරදහු

ම පියාණෙනි, අද පමණක් නොව ඈත අතීතයේ ද මැය මා වෙනුවෙන් ම පතිභක්තියෙන් උන් අයුරු සිහිපත් කර දුන් සේක.

"බෝසතුන් සඳ කිඳුරුව උපන් පෙර අත්බවෙක ප්‍රිය වූ කිඳුරිය වූ යශෝධරා කෙරේ ප්‍රේමයෙන් ඈ අත්පත් කර ගැනීමට බරණැස රජකු කිඳුරාට ඊයෙන් විද්ද කල කිඳුරිය පිළිකුලෙන් ලජ්ජාවෙන් රජු මුව නොබලා දයාබරිත ප්‍රියයා වෙනුවෙන් කඳුළු සලමින් දෙවියන් යැද්දා ය.

සක්දෙව් රජ පඬුපුල් අස්න උණු වැ මේ අනුවේදනීය සිද්ධියෙන් හද කම්පාවැ වහා මනුලොව අවුත් කිඳුරා සුවපත් කර අභය දී කිඳුරියට අත්පත් කර දුන්නේ ය." සඳකිඳුරු දා කථා වස්තුව අතීත කථා පුවත යශෝධරාවගේ ආත්මීය බැඳීම ස්ඵුට කරයි.

මෙබඳු උසස් ගති ඇති කතුන් මුළු ලොවට ආශිර්වාදයකි. ආශ්චර්යවත් යශෝධරා දේවි චරිතාපදානය කාන්තාවගේ රුව ගුණ සොබා කෙසේ විය යුතු'දැයි සැබෑ දිශානතිය කියාපාන මාලිමාවකි.

අද්‍යතන යුගයේ කුල කත මංගල පෝරු මස්තකප්‍රාප්ත වනුයේ දහසක් අපේක්ෂා දල්වාගෙන යැ. මනාල මනාලි යුවළ අතබැඳි හුය ද, මංගල මුදුව ද, දෙහදක ඒකාත්මික බව හදවතේ සනිටුහන් කරවයි. එනමුදු එකිනෙකාට ශාප කරමින්, වැඩිකල් නොගොස් දික්කසාද වන ළඳුන්, වැදූ දරුවන් ගැන ද නොසලකා හිතුමතේ ක්‍රියා කරන ළඳුන්, සිල්පද බිඳ දමා පව්කාර දිවි ගෙවන ළඳුන්, ප්‍රේමාන්විතවැ, අතගත් තම වල්ලභයාණන්ගේ සුළු කරුණු වුව සකසා ගත නොහැකි ළඳුන්, යශෝධරා චරිතාපදානය ආදරයෙන් කියවිය යුතු වෙයි.

කරුණාව , දයාව, ස්වාමි භක්තිය, ඉවසීම, දරා ගැනීම ප්‍රියවිප්‍රයෝගයෙන් නොසැලීම, ප්‍රමාණාතික්‍රාන්ත පුත්‍ර ස්නේහය, ස්වාමියන්ගේ නැදිමයිලණුවන් කෙරෙහිවූ ආදර ගෞරවය, මේ සියලු ගුණාංග මුසු යශෝධරා දේවි චරිතය ලොවට පාඩම් උගන්වයි. විමුක්තිය උදෙසා හැර ගිය ස්වාමි පුත්‍රයාට රහල් කුමරු සමඟින් තනිවූ යශෝධරාවන්ගේ සෙත්පැතීම මනුසත් හද කම්පා කරවයි. දෙනෙතට කඳුළු නංවයි. සැබෑ බිරිඳකගේ ගුණ ගඟ සිසිලස විහිදුවයි. පිවිතුරු හදෙහි අකලංක ස්වාමි භක්තිය කියාපායි.

**සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳුට**
**නිබඳ බොජුන් රසකර දුන් වළඳන්ට**
**සුවඳ පලාපල මැව්යන් හිමියන්ට**
**සුවඳ මල් නිතර පිපියන් රන් කඳට**

මේ යශෝධරා දේවි හද සන්තානයේ රැව් පිළි රැව් දුන් සිදුහත් බෝසතුන් වෙනුවෙන් වූ හෘදයාංගම ප්‍රාර්ථනාවයි.

**කැලේ තිබෙන කොයි දේවත් රස වේ වා**
**මලේ බමරු ලෙස පිරිවර ලැබ දේ වා**
**අව්වේ තිබෙන රැස්මාලා අඩු වේ වා**
**ගව්වෙන් ගව්ව දිවමාළිග සෑදේ වා**

දේශයේ දියණිවරුනි, යශෝධරා පිළිවෙත් අභරණ පැළඳි ඔබ විශ්වයටම ශාන්තිය ගෙන දෙන පින්සරු කාන්තා රත්නයක් වනු ඇත.

***මෙම ලිපියේ පළමු කොටස උඳුවප් පුර පෝදා පත්‍රයේ (07) පළ විය***

# ලැබෙන දෙයින් නොසෑහීම අසහනයට මූලයි

**දරුවන් තමන් යම් පමණක බුද්ධි මට්ටමකට පැමිණ ස්වාධීනව කටයුතු කරන්නට හැකි අවස්ථාවට පත් වෙන තුරුම දෙමාපිය අවසරයකින් තොරව හිතෙන හිතෙන ක්‍රියාකාරකම්වල නොයෙදිය යුතු ය.**



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික හා උපාධ්‍යාය ධුරන්ධර වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

තම වැඩි හිටි පිරිස් පෙන්වා දෙන අවවාද උපදෙස්වලින් බැහැරව ක්‍රියා නොකිරීමත් සැහැල්ලු බව දියුණු කර ගැනීමට හේතු වෙනවා. ඒ වගේම තමා තමන්ට දෙමාපියන්, වැඩිහිටියන්, කල්‍යාණ මිත්‍රයන් දෙන උපදෙස් නොසලකා, ළමා කාලයේ දී, ශිෂ්‍ය ජීවිතයේ දී ගුරුවරුන්ගේ බහට අවනත නො වී කටයුතු නොකළ යුතු යි. විවිධ අනවශ්‍ය පොතපත බලමින් වර්තමානය වන විට ජංගම දුරකථන, අන්තර්ජාලය හරහා විවිධ ක්‍රියාකාරකම්වල යෙදීම නිසා ළමා පරපුර විශේෂයෙන් පරිහානියට යන්නේ ඔවුන්ගේ විවිධ ඕනෑ එපාකම් ඉටු කර ගැනීමට තරගකාරිව පෙළඹීම නිසයි.

මේ හැම එකකින් ම සිදු වන්නේ අසහනකාරි කාර්ය බහුල ජීවිතයකට පෙළගැසීම යි. තම මවුපියන් තමන්ට ලබා දෙන ඇඳුම් පැළඳුම්, පාවහන් ආදි බාහිර දෙයින් දරුවන් සෑහීමකට පත් නොවන්නේත් මේ තත්වය නිසයි

ඒවගේම භික්ෂූන් වහන්සේ භාෂ්‍යාරාමතායෙන් වැළකෙන්නා සේ ගිහි සමාජය ද නිතර නිතර දොඩමලු නොවී, නොගැලපෙන වාචාල කථා කරමින්, ඕපාදූප කථාබස්වල නියැළෙමින් වැඩි පුර කාලය ගත කිරීම ද අප්පකිච්ච බවෙන් තොර වීමක් කොට සැලකෙනවා.

මේ නිසා ශිෂ්‍යයින් නම් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවලට කාලය ඉතිරිකර ගැනීම පිළිබඳ ගැටලුවක් ඇති වෙනවා. වැඩිහිටියන්ට ඔවුන්ගේ දෛනික කටයුතුවලට බාධා එල්ල වීමෙන් ඔවුන්ගේ දෛනික රාජකාරි කටයුතු ප්‍රමාද වෙනවා. අනිත් අතින් රජයේ හෝ වෙනත් වෘත්තියක් කරන අයෙක් නම් ඔවුන්ගේ නියමිත වගකීම් ඉටු කරන්නට කාලය මඳවීමෙන් දෝෂදර්ශනයට පවා ලක්වෙමින් අසහනකාරිව ජීවිතය පවත්වා ගෙන යන්න සිදු වෙනවා.

මේ හැම අවස්ථාවක දී ම පෙනී යන්නේ තමන්ගේ නියමිත රාජකාරි හෝ වගකීම් හෝ ඉටු කරන්ට තිබෙන කාලය මඳ වීමෙන් අසහනකාරිව ජීවත්වීම යි. එපමණක් නොව භික්ෂූන් වහන්සේ සම්බන්ධව නිද්දාරාමතාව ගැන කරුණු සඳහන් කළ ආකාරයෙන් ම අලසබව, කම්මැළිබව, නිදිබර ගතියෙන් ඈලිමෑලිව ක්‍රියා කිරීම නිසා ද සිදුවන්නේ තමන්ට නියමිත කටයුතු වෙලාවට කලාවට ඉටු කර ගන්නට නොහැකි වීමෙන් ගිහි ප්‍රජාවට ද අසහනකාරීව විසිරුණු සිතින් ක්‍රියා කිරීමට සිදුවීම යි.

මෙහි දී අප විසින් අවධාරණය කරන්නේ මේ ආකාරයෙන් අපට වැඩ වැඩි වී අසහනයට පත්වීමට හේතු වන්නේ නියමිත වේලාව තුළ අපේ අරමුණු ඉටු කරගන්ට තිබිය දී එම කාලය වෙනත් අනවශ්‍ය දෑ සඳහා පෙළඹීමටත්, සීමිත කාලය තුළ තමන්ගේ වයසට, රැකියාවට, තනතුරට අදාළ කාර්යයන් ඉටු කරන්නට යාමෙන් කාර්ය බහුල ජීවිතයක් ගත කරන්නට සිදුවීම නිසයි. වර්තමාන සමාජය පිළිබඳ ව විමසීමේ දි මේ තත්ත්වය වඩාත් දැඩි ලෙස පෙනී යන කරුණක් බව අප විසින් සිතට ගත යුතු වෙනවා.

***මෙම ලිපියේ පළමු කොටස උඳුවප් පුර පෝදා පත්‍රයේ (07) පළ විය***



# දැවෙන ගිනිගොඩක නොදැවුණු පින් සිත

**ශාන්තිනායක බුදුපියාණන් වහන්සේ කොසඹෑ නුවර අසල සුංසුමාරගිරි පර්වතයෙහි වැඩ වසන සමයෙකි. කොසඹෑ රජු ද, අගබිසව වෙස්සමිත්තාවෝ ද නිරතුරු බුදුහිමි හමුවෙමින් දහම් ඇසූහ. බුදුහිමියන් කෙරේ මහත් සැදැහැයෙන්, මමත්වයෙන් පහන් සිතින් විසූහ.**

දිනක් පසල් දනව් රජෙක් කොසඹෑ නුවර රාජ්‍යය අල්ලා ගනු රිසියෙන්

"රාජ්‍යය දෙව. නැතහොත් සටන් කරව"යි හසුන් එවුවේ ය. රජු බිසවුන් අමතා "දේවිය රාජ්‍ය අනිකකු හට නොදෙමි, යුද කරමි, ඔබ ද මා සමඟ පැමිණෙන්න. සටන් කරන අයුරු බලන්න. මා යුද්ධයෙන් පරාජය වුවොත් රක්ත වර්ණ කොඩියක් ඔසවමි. ඒ ලකුණු දකින ඔබ වහා කොසැඹෑ නුවරට පලා යන්න."

"යහපති ස්වාමීනි, ඔබතුමා සටනින් ජය ගන්න."

යුද බිම් මහ සටන් ය. කොසැඹෑ රජු, කෙසෙල් වනයට වන් මතැත් පොව්වකු සේ සතුරන් හෙළමින්, අසුන්, ඇතුන් නසමින් ජයග්‍රාහී ලෙසින්, පෙනී යයි. එහෙත් තමන්ට පරාජය අත්වන බව රජුට පෙනේ. බිසවට පෙනෙන ලෙස රතු කොඩියක් නංවා සටන් කරමින් යුද බිම සතුරන් අතින් මිය යයි.

වෙස්සමිත්ත, බිසව ඇසිපිය නොහෙළා සියල්ල බලා සිටියා ය.

"ඕහ්, රතු කොඩියක්.... රජතුමාට පරාජයක්", බියට පත් දේවිය කොසැඹෑ නුවර බලා යන්නීය. ඇය කොසැඹෑ රජුගේ අගබිසව බව හඳුනා ගත්තෝ පසල් දනව් රජු වෙත ඇය ගෙනවිත් දෙති.

ෂහ්, කොසඹෑ නුවර රජ්ජුරුවන්ගේ අග බිසොවගෙ ලස්සන. පුදුම රූපශ්‍රීයක්. ඈ මගේ අග මෙහෙසුන් කරගන්නව"

රජතුමා අභිෂේක මඟුල් සඳහා ඇමතිවරුන්ට අණ කරයි. ඔවුහු අග බිසෝ තනතුරට පත් කිරීමට බිසවුනට යාඥා කරති.

ඇමතිවරුනි, මට අභිෂේකයෙන් ඇති ප්‍රයෝජන මොනවාද? නුඹලා යන්න"

ඇමැතිවරු අග මෙහෙසුන් වීමේ අකැමැත්ත රජුට කීහ. රජු එතුමිය ගෙන්වා ඒ ගැන අසයි.

දේවිය කවර කරුණක් නිසා ඊට අකැමැත්තේ ද"

"දේවයන් වහන්ස, මෙය හොඳින් අහන්න. මට සියලු සම්පත් දුන් මගේ ස්වාමියා වූ රජතුමා මිය ගියා. එතුමා සොළොස් දහසක් බිසොවුන්ට නායක අගබිසෝ තනතුරට මා පමුණුවා මේ තාක් ඔහුගේ හදවත ලෙසින් මා රක්ෂා කළා. දැන් එතුමා සිහිවන කල මගේ සිත, කය වියෝග සෝක නමැති ගින්නෙන් දැවෙනවා. මම තව රජකුට අගමෙහෙසුන් වුණා නම් ඒ රජුටත් මෙහෙම විපත් ආ කල නැවතත් මම ඒ දුකෙන් කෙලෙස මිදෙම් ද ?, ඒ නිසා මම අගමෙහෙසුන් තනතුරුට අකැමැත්තෙමි. දැන් මම වියෝග සෝක ගින්නෙන් දිලිසෙන ශරීර ඇතියෙමි. මේ සෝකයේ සිටින මම මතුවන සෝකය කෙසේ දුරු කරම්ද? ගිනි නිවනු කැමැති නැණවතෙක් ඇවිළෙන ගින්නට පිදුරු බහාලයි ද?"

දේවියගේ මෙබස් රජුගේ කෝපයට හේතු විය.

"තී අභිෂේකයට අකැමැති නේද? දැන්ම මම තී ගින්නේ දා වධ කරවමි"

වහා ම මහා ගිනි සෑයක් කරන ලෙස දැන්වූ රජතුමා මෙසේ අණ කරයි.

"තිගේ මළ සැමියා පතා හිඳින් තී ද ගින්නට පැනිය යුතු ය"

"දේවයන් වහන්ස, නිරපරාධයෙන් මෙසේ වධයට පමුණුවාලීම මහා අකුසල්. ඒ විපාකය දෙලොවට ම අවැඩ ය, බරපතළ ය."

පෙර රජ දරුවෝ මහණ බමුණන්, මවුපියන්, බාල දරුවන්, රෝග ව්‍යසනයෙන් වුවන් කාන්තාවන් මැරීම ප්‍රශංසාවට ලක් නොකළහ. නීතියේ ද එය නැත. ඒ අනුව මම මේ වධයට සුදුස්සෙක් නොවෙමි."

"තිගේ ඔය පණ්ඩිත බසින් මට වැඩක් නැහැ. මගේ අණ තිට වෙනස් කළ නොහැකියි. රාජ පුරුෂයිනි, වහා මැය ඇවිළෙන ගිනිමැළයට දමා පුලුස්සව."

රාජ පුරුෂයෝ සිවුමැලි බිසව මල්දමක් සේ දෑත් දෙපය මිරිකා අල්වාගෙන ගිනි දේවියට දෙන බිලියක් සේ ගිනිමැළයට දැමූහ. ඒ අවස්ථාවේ මට මෙහි කාගේවත් පිහිටක් නැත. තිසරණ පිහිට කරමි'යි සිතමින් බුදු සරණ යමි, දහම් සරණ යමි, සඟ සරණ යමි'යි සිහි කරමින් ගින්නට වන්හ.

ආශ්චර්යයක මහත, ඇවිළෙන ගින්නෙන් බිසවගේ රෝම කූපයකට වත් හානියක් නොවීය. රතු පලසක් පොරවාගෙන සිරි යහනේ සැතපෙන ලෙසින් බිසොව සැප සේ හොත්තාහ.

රජ බියෙන් තැති ගත්තේ ය. මම කළේ මහා අපරාධයක්. ගින්නෙහි වන් දරුවකු කෑ මොරගාමින් වඩාගන්නා මවක සේ බිසවුන් දෙඅතින් ඔසවා ළයෙහි හොවාගෙන රාජාසනයේ වඩා හිඳවා දොහොත් මුදුන් තබාගෙන, ක්ෂත්‍රිය කන්‍යාවක දුටු සැඬොලකු සේ, ආදරයෙන් නැමී එකත්පස්ව සිට

"ස්වාමි දියණියෙනි කවර කරුණකින්, ආනුභාවයකින් මෙසේ ශරීරය නොපිළිස්සුණේ දැයි විමසීය.


"දේවයන් වහන්ස, මෙලොව යමකුට භයක් ආ විට තුණුරුවන් සරණ හැර මවුපිය, නෑදෑ හිත මිතුරන් දෙවියන් ආදීන් මෙන්ම, ඖෂධ, බලිබිලි, යාග කිරීම් ආදි ශාන්තිකර්ම ද පැමිණියත් ඒ භයට පිහිටට රැකගත නොහැකි ය. ඒ නිසා මම පිහිට තිසරණය සේ සලකා තිසරණ පිහිට කර ගතිමි. ඒ ආනුභාවයෙන් ඇවිළෙන ගිනිමැළයෙන් මගේ රෝම කූපයක්වත් හුණු කළ නොහැකි විය. ඒ නිසා සියලු සම්පත් ගෙන දෙන, දෙලොව සැප සලසන අභිවෘද්ධිය ගෙනෙන, හැම ආරක්ෂාව සලසන, පිහිට වන බුදුන් සරණ යන්න. දහම් සරණ යන්න. සඟ සරණ යන්න"

රජතුමා බිසවුන් ක්ෂමා කරවාගෙන මහත් සත්කාර කොට අද සිට නුඹ මගේ මව යැයි බිසවුන් මව් තනතුරේ තබා බුදුන්, දහම්, සඟ තෙරුවන් සරණ ශීලයෙහි පිහිටියහ.

රැස්ව සිටියෝ ද ඒ ආශ්චර්යය දැක සරණ ශීලයෙහි පිහිටා සිටියහ. සියල්ලෝම දානාදි කුසල සම්භාර රැස්කොට කර්මානුරූපව ස්වර්ග ලොවට වන්හ.

මෙලෙස ඒ වෙස්සමිත්තා බිසව උතුම් වූ සරණ ශීල මාත්‍රයක් ඉගෙන එම තෙරුවන් බෙලෙන් ඇවිළෙන ගිනිදැල් මැද කිසිම පීඩාවකට නොපැමිණ සිසිලස් සැපයම ලැබීය. ඒ නිසා උතුම් සරණ සීලය නිරතුරු රැකගෙන, සසර සියලු සැප සම්පත් ලබමින් කෙළවර නිවන් සම්පත් ලබා දෙන්නා වූ තිසරණ ශීලයෙහි පිහිටා සිටින්න.

**ආචාර්ය සිරිපාල මාදුවගේ**



## සසර දුක් ගිනි නිවන්නට



පුංචි පුතු මගෙ මැණික
දඟකර දුවලා හැංගෙන
නිවසෙ සැවොමත්
හිනා ගස්සන
ගුටි නොකන මගේ
සුරතල් පුංචි පුතු
නිවසෙ මිණි පහන
සසරෙ සැම දිනම
හරිම හරි වෙනස් දැන්
පෙනෙන්නට නෑනේ දඟ සිත
හැංගිලා දෝ තැනක
ගත පුරාවට
සංවරය දෝරෙ ගලන
ඉර බහින සැන්දෑවේ
වතු සුද්ද මල් වට්ටියක්
පුංචි දෝතින් දරා
තෙරුවනට පුද දෙන
පුංචි පුතු මගෙ මැණික
ඇසුණා ද මගෙ පුතුට
සිත නිවන බුදු බණ
ගෙවුණු පොහෝ දිනවල
ඊයේ සවස අප්පච්චිට
පැවසුවා ද රහසින
කසාවතක් බබළන මඟ
සිතුණා ද මල් සිතට
බුදු සමිඳු දෙසුව මේ
උතුම් සම්බුදු සසුනෙ
සසර දුක් ගිනි නිවාලන්නට
ලොවට දම් දෙසන්නට
පුංචි පොඩි සාධු වී......

**නීතිඥ කීර්ති කපුවත්ත**
රිදීගම

# පවිටු මිතුරා අයහපත ම ගෙන දෙන්නේ ය ...

*(ජාතක අටුවාව- මනෝජ ජාතක කතාව ඇසුරිනි)*

**අප මහ බෝසතාණන් වහන්සේ, අතීතයේ සිංහරාජයෙක් ලෙස ස්වකීය සිංහ ධේනුවත් සමඟ එක්ව වාසය කෙළේ ය. ඔවුන්ට පුතෙක් හා දුවක් වශයෙන් දරුවෝ දෙදෙනෙක් වූහ. 'මනෝජ' යනු ඒ එකම පුතුගේ නමයි. මනෝජ ද තරුණ වියට පත්වූ පසු ගැලපෙන සිංහ ධේනුවක් සමඟ පවුල් විය.**

මෙසේ ඔවුන් විසූ ගුහාවේ මුළු පවුලේ එකතුව පස්දෙනෙකි. මනෝජ කුළු මීමුන් ආදී වන සතුන් මරා ගෙනවුත් සිය මවුපියන් ප්‍රධාන පවුලේ උදවියට දී ඔවුන් පෝෂණය කරයි.

එක්දිනක් ගොදුරු බිම ඇවිදින මනෝජට සිවලකු දක්නට ලැබුණි. 'ගිරිය' නම් වූ මේ සිවලා තරුණ සිංහයා දුටු සැණින් පලා යන්නට උත්සාහ කළත්, එය නිශ්ඵල බව දැන බයාදු ලෙස ගාත් දෙපසට දමා බිම වැතිරුණේ ය.

ඒ දුටු සිංහයා

"මිතුර, මේ කිමදැ?"යි ඇසීය.

"ස්වාමීනි, මම ඔබතුමා දැකීමට පැමිණියේ ඔබේ ළඟ සේවාකම් කරමින්, උපස්ථාන කරමින් උදව්වීමට යැ"යි සිවලා කීවේ ය. එවිට සිංහයා තමා ඊට කැමති බව සිවලාට දැනුම් දී, ඌත් කැටුව තමා වසන ගුහාවට ගියේ ය.

සිවලා දුටු බෝසත් සිංහ රාජයා,

"පුත මනෝජ, සිවල්ලු නම් දුස්සීලයෝ ය. පාප ධර්මයෙහි ඇලුණු අය වෙති. අවැඩෙහි යොදවන්නෝ ම වෙති. එබැවින් එවැන්නකු ළං කර නොගත යුතු යැ"යි සිය පුතුට අවවාද කෙළේ ය.

එසේ වුවත් ඒ කිසිවක් ගණන් නොගත් මනෝජ, සිවලා සමඟ ම සියලු ගමන් බිමන් ගියේ ය.

කිසියම් දවසක අශ්ව මස් කෑමට ආශාවක් ඇති වූ සිවලා, මනෝජ අමතා,

"ස්වාමීනි, අප විසින් අශ්ව මස් හැර වෙනත් නො කෑ මසක් නැත. ඒ නිසා අපි අශ්වයකු අල්ලා ගනිමුදැ?"යි කීවේ ය.

"මිතුර, අශ්වයන් සිටින්නේ කොහිද?"

"ස්වාමීනි, බරණැස් නුවර නදී තෙර ඕනෑ තරම් අශ්වයෝ සිටිති" යි සිවලා කීය.

උගේ වචන පිළිගත් මනෝජ ඌත් සමඟ එකී නදිය වෙත ගොස්, නදියෙහි බැස නාන අශ්වයන් දැක, ඉන් එකකු අල්ලාගෙන, සිය පිට මත දමාගෙන වේගයෙන් අවුත් නැවතුණේ, සිය නවාතැන වන ගල් ගුහාව ළඟ ය. එදා පවුලේ සියලු දෙනා ද, සිවලා ද අශ්ව මස් හිතේ හැටියට කෑහ. කෑමෙන් පසු සිය පුතු ඇමතූ සිංහරාජයා,

"පුතණුවනි, අශ්වයෝ නම් රජුට අයත් සත්ත්ව විශේෂයකි. රජවරු විවිධ මායා ඇති අය වෙති. එබැවින් ඔවුහු දක්ෂ දුනුවායන් යොදා සතුරන් මරවති. එබැවින් අශ්ව මස් කන සිංහයෝ වූ කලි, දීර්ඝ ආයුෂ ඇත්තෝ නොවෙති. ඒ නිසා මින් මතු අශ්වයන් අල්ලන්නට නොයව"යි, තරයේ මනෝජට අවවාද කෙළේ ය.

පියාගේ වචනය මායිම් නොකළ, මනෝජ සිය කටයුතු සුපුරුදු ලෙසින්ම කරගෙන ගියේ ය. මේ අතර සිංහයකු තමාට අයත් අශ්වයන් අල්ලා මරන බව දැනගත් රජතුමා, ඇතුළු නුවර ම අශ්වයන්ට සුව සේ විසිය හැකි භූමියක් වෙන්කොට, එහි විශාල පොකුණක් ද කරවීය. සිවලා සැපයූ තොරතුරු අනුව එහි ගිය මනෝජ, එතැනින් ද අශ්වයන් අල්ලා මරාගෙන ගියේ ය.

අනතුරුව ඒ ගැන තොරතුරු දැනගත් රජතුමා වෙනම අස්හලක් සාදවා, අශ්වයන් එහි ගාල්කොට තණකොළත් වතුරත් වෙනත් අවශ්‍යද දෑ ද, එතැනට ම සැපයීමට කටයුතු සංවිධානය කෙළේ ය. සිවලාගේ මඟපෙන්වීම යටතේ එහි යන්නට පවා, මනෝජ එඩිතර විය. ඒ ස්ථානය පවුරකින් වටකොට තිබුණි. එහි ගිය මනෝජ එක්වරම පවුර මත පැන, එතැනින් අස්හලට ඇතුළු වී එහි සිටි අසුන් අතරින් එකකු පැහැර ගත්තේ ය. මේ සිද්ධිය පසුදා ම රජතුමාට ආරංචි විය.

විදුලි එළියෙන් සතකු විද මැරිය හැකි දුනුවායකු කැඳවූ රජතුමා,

" නුඹට රාත්‍රී කාලයෙහි සිංහයකු විඳ මරා හෙළන්නට හැකි දැ?"යි ඇසීය. ඒ හැකියාව තමාට ඇතැයි පිළිගත් දුනුවායා රජුට පොරොන්දු වී අස්හලේ පවුර සමීපයෙහි, සිංහයා පවුරට ගොඩවෙන ස්ථානය සලකා, ඒ අසල අටල්ලක් බැඳ, එහි සැඟව සිංහයාගේ පැමිණීම අපේක්ෂා කරමින් බලා සිටියේ ය.

මේ අතර සිවලා ද කැටුව පැමිණි මනෝජ, අස්හල සමීපයෙහි වූ සුසාන භූමියක සිවලා නවත්වා, තනිව ම අශ්වයකු අල්ලා ගැනීමේ අදහසින් ඇතුළු නුවරට පිවිසියේ ය. සිංහයා අස්හල සමීපයට පැමිණ එක්වරම එහි තාප්පය උඩට පැන්නේ ය.

ඒ දුටු දුනුවායා "ගොදුර ගැනීමට පැමිණෙන සිංහයා ඉතා වේගවත් ය. ඉතා තියුණු ස්වරූප ඇත්තේ යැ"යි සිතා, එවේලෙහි සිංහයාට විදීමට තීරණය නොකොට, අශ්වයකු මරාගෙන ඒ ගොදුර ඔසවාගෙන අපහසුවෙන් සිංහයා පැමිණෙන විට, විදීම වඩාත් ප්‍රඥගෝචර යැ'යි, අදිටන්කොට ගෙන ඒ අවස්ථාව පැමිණෙන තෙක්, නො ඉවසිල්ලෙන් බලා සිටියේ ය.

මේ අතර අශ්වයකු මරාගත් සිංහයා, ඒ බරත් ඔසවාගෙන, අපහසුවෙන් මඳ වේග ඇතිව ගාටමින්, පවුර සමීපයට පැමිණියේ ය. ඒ දුටු දුනුවායා ඉතා තියුණු ඊතලයක් ගෙන, සිංහයාගේ පසුපසට එල්ලකොට විද්දේ ය. සිංහයාගේ පසු පෙදෙසින් ඇතුළු වූ ඊතලය උගේ හිස සමීපයෙන් නික්ම අහසට විසි විය. ඊතල පහර කෑ සිංහයා මර හඬ තැලීය.

පිට නුවර අස්හලට නුදුරෙහි සුසාන භූමියෙහි හුන් සිවලා සිංහයාගේ මරහඬත්, දුනුදියේ නාදයත් අසා,

"මාගේ ස්වාමියා ස්ථිර වශයෙන් ම මරණයට පත් වූයේ යැ"යි සිතා 'මළ අය සමඟ කුමන විශ්වාසයක් දැ'යි සලකා, පෙර තමා විසූ ස්ථානය සිහිකොට, එහි යන්ට පිටත්වෙමින්, තමාට ම මෙසේ කියා ගත්තේ ය.

"ඒකාන්තයෙන් මාගේ මිත්‍ර සිංහරාජයා නැසුණේ ය.දැන් ආරක්ෂිත ස්ථානය නම් කැලය යි. සුව සේ එහි යමි. මැරුණු අය තවදුරටත් මිතුරෝ නොවෙති. ජීවත් වුවොත්, මට යහලුවන් ලැබිය හැකි ය."

ඊතල පහර කෑ නමුත් සිංහයා සිය ගොදුර අත්හළේ නැත. සිය ගොදුර ඩැහැගත් ඌ, එකම වේගයෙන් සිය ගුහාව වෙත ගොස්, අසුගේ මළකුණ ගුහා දොරටුවෙහි හෙළනවාත් සමඟම, මැරී වැටුණේ ය. ඒ ශබ්දය ඇසී ගුහාවෙන් බැහැරට ආ පවුලේ උදවිය ලෙයින් වැකුණු සිරුරු ඇති, ලේ වැගිරෙමින් අවසන් නින්දෙහි වැටී හුන්, පවිටු මිතුරන් සේවනය කිරීමෙහි ප්‍රතිඵල වශයෙන්, සිය ජීවිතයෙන් වන්දි ගෙවූ, මනෝජ දුටහ.

ඒ දුටු මනෝජගේ පියා මෙසේ ප්‍රකාශ කළේ ය.

"පවිටු ජනයා ඇසුරු කරන්නා, වැඩි කලක් සැප නොලබයි. අනුශාසනා නොලැබූ, මැරී සිටිනා මනෝජයා දෙස බලන්න."

මව මෙසේ ප්‍රකාශ කළා ය. "පවට නැමුණු පුතකු නිසා මවක් සතුටු නො වේ. තමාගේම ලේවල ගිලී මැරී සිටිනා මනෝජයා දෙස බලන්න.

සොයුරිය මෙසේ ප්‍රකාශ කළාය. "ඒකාන්තයෙන් යමෙක් යහපත පෙන්වා දෙන හිතවතුන්ගේ වචන අනුව ක්‍රියා නො කෙරේද? ඒ පුරුෂයා පවිටකු බවට ද පත්වේ. මේසේ මරණයට පැමිණේ."

බිරිඳ මෙසේ ප්‍රකාශ කළා ය. "යම් උත්තමයෙක් නීචයන් සේවනය කෙරේ ද? මෙසේ ඒ තැනැත්තා ඊටත් වඩා පවිටෙක් වේ. නීච ජනයන් සේවනය කරන ලදුව, උසස් තත්ත්වයේ ඊතල පහරකින් විනාශ කරන ලද, මේ උතුම් සිංහරාජයා දෙස බලන්න."

ජාතක කථාව අවසානයේ බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළ සේක.

"හීනයන් සේවනය කරන පුරුෂයා පිරිහේ. සමානයකු ඇසුරු කරන්නා කවදාවත්, නො පිරිහෙන්නේ ය. උතුමකු වෙත එළඹෙන්නා වහා දියුණු වේ. එබැවින් තමාට වඩා උතුම් අයම ඇසුරු කරන්න."

එදා සිවලා නම්, දේවදත්ත ය. මනෝජ නම්, දෙවුදතුන්ට පක්ෂ භික්ෂුව ය, සොයුරිය නම්, උප්පලවණ්ණා ය. බිරිය නම්, ඛේමා භික්ෂු ණී ය. මව නම්, රාහුල මාතා ය. පියා නම්, බෝසතාණන් වහන්සේ ය.

නයනා නිල්මිණී



# දෙව්ලොවට මඟ පෙන්වූ කුසල් සිත




දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**


**පෙර ලංකාද්වීපයේ මධුඅංගණ නමින් ගමක් තිබුණා. ගිරි විහාරය නම් වනගත ආරාමයක් ද පිහිටා තිබුණේ මේ සමීපයේ. පිණ්ඩපාතයෙන් පමණක් යැපෙන භික්ෂූන් වහන්සේ නමක් ඒ ආරාමයේ වැඩ සිටියා. ගම්වැසියන් වගේම සෙසු භික්ෂූන් වහන්සේත් උන්වහන්සේ හඳුනා ගත්තේ 'චුල්ල පිණ්ඩපාතිය තිස්ස තෙරුන් වහන්සේ' කියලා.**

එක් වේලක් පමණයි උන්වහන්සේ වැළඳුවේ. එයත් පිණ්ඩපාතයෙන් ම තමයි ලබා ගත්තේ. පිණ්ඩපාතිය තිස්ස හිමි කියූ නම හැදෙන්න හේතුව එයයි.

උන්වහන්සේ හැමදාම උදෙන්ම පිණ්ඩපාතයේ වැඩම කරනවා. මෙ සමයේ මධුඅංගණ ගමේ ජීවත් වුණා දෙමළ දොරටුපාල කියලා තරුණයෙක්. ඔහු විවාහ වෙලයි හිටියේ. හැබැයි දරුවෝ හිටියේ නෑ. ඔහු රැකියාව වශයෙන් කළේ මාළු මරණ එක. හැමදාම උදෙන් ම අවධිවෙනවා. බිරිඳ හදා දෙන කෑම එකත්, බිලීපිත්තකුත් අරගෙන යනවා වැවට. තෙරුන් වහන්සේත් වැඩම කරන්නේ මේ වේලාවට ම තමයි.

උන්වහන්සේ දිනපතාම දෙමළ දොරටු පාලයාගේ මේ ක්‍රියාව දකිනවා. මෙහෙම අවුරුදු පනහක්ම ගෙවී යනවා. තෙරුන් වහන්සේත් දැන් බොහොම වයසට ගිහින්. තරුණයාත් වයසට ගිහින්. දින ගණනාවක් ම පිණ්ඩපාතයේ වැඩම කළත් දෙමළ දොරටුපාලක දකින්න ලැබුණේ නෑ. තිස්ස තෙරුන් වහන්සේට හිතුණා ධීවරයාට මොනව වුණාදැයි හොයා බලා දුකකට පත්වෙලා නම් පිහිට වෙන්න ඕන කියලා.

දවසක් පිණ්ඩපාතයේ වැඩම කළ අවස්ථාවේ දෙමළ දොරටු පාලයාගේ නිවසටත් ගොඩ වුණා. බිරිඳ තෙරුන් වහන්සේට ආසන පැනෙව්වා. වහාම ගෙතුළට ගිහින් ඇඳෙහි වැතිර සිටින සැමියා අමතා

'ස්වාමිනි, ගිරිවිහාරවාසී පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ වැඩම කර ඉන්නවා, සුවදුක් විමසා යන්න. ඔබව දකින්න මෙ තැනට වඩින්න කියන්නද? කුමක්ද මම කළ යුත්තේ?'යි විමසා සිටියා. "තෙරුන් වහන්සේ පුරා වසර පනහක් මට හැමදාම උදේ ම මුණ ගැසුණා. මම බත් හරලුවක්වත් දන් දුන්නේ නෑ. එහෙම කළ මා බලන්න උන්වහන්සේ අද වැඩම කර තියනවා. මම උන්වහන්සේට කළ උපකාරයක් නෑ. මගේ මොන ගුණයක් නිසාද උන්වහන්සේ වැඩම කළේ? මට උන්වහන්සේගේ මුහුණ දකින්න බෑ. ඒ නිසා උන්වහන්සේට කියන්න විහාරයට වඩින්න කියලා"යි බිරිඳ අමතා පිළිවදන් දුන්නා. ඇයත් සැමියාගේ උපදෙස් අනුව නිවසේ ඉදිරියට ගොස් තෙරුන් වහන්සේට වන්දනා කර 'ස්වාමිනි, දොරටුපාල ඔබ වහන්සේ දකින්න අකමැතියි කියනවා. විහාරයට වැඩම කරන්න කියලා කියනවා"යි පවසා සිටියා. තෙරුන් වහන්සේත් එය පිළිගත්තා. විහාරයට වැඩම කරන්න පාත්‍රය අරගෙන නිවසෙන් පිටත් වී යන්නට සූදානම් වෙමින් නැවතත් මෙහෙම ඇහුවා.

'පින්වතිය, දොරටුපාලට ඇඳෙන් නැගිටින්න පුළුවන්ද? කාය ශක්තිය හොඳින් තියෙනවාද? කෑම බීම ගන්න පුළුවන්ද?'යි විමසා සිටියා. බිරිඳත් තෙරුන් වහන්සේට පිළිතුරු දෙමින් තම සැමියාගේ කායික දුබල බවත්, අවසන් සමය ගත කරන බවත් දන්වා සිටියා. තෙරුන් වහන්සේට මහත් වූ අනුකම්පාවක් ඇති වුණා. 'දොරටුපාල අකැමැති වුණත් මම ඔහුට පිහිට වෙන්න ඕනි' යි හිතලා ඇතුළු ගෙට ගිහින් ඇඳ සමීපයේ ආසනයක වැඩ සිට 'දොරටුපාල, දැන් ඔබට කොහොමද? මම ඔබට පිහිට වෙන්නයි වැඩියේ. සිහි උපදවා ගෙන පන්සිල් ගන්න'යි පවසා පළමුව සරණ ගමනය සමාදන් කරවන්න පටන් ගත්තා. සිහියෙන් එය සමාදන් වුණා. පළමු ශික්ෂා පදය දේශනා කරනවාත් සමග ඔහු මරණයට පත් වුණා. තෙරුන්වහන්සේ 'මෙයත් සෑහේ'යි පවසා විහාරයට වැඩම කළා.

දොරටුපාල මිය ගිය සැනින් චාතුම්මහාරාජිකය නම් දෙව්ලොව උපන්නා. බොහෝ දිව්‍ය සම්පත් විඳින්න භාග්‍ය උදා වුණා. පෙර කුමන පිනක් නිසා මට මෙ තරම් දිව්‍ය සම්පත් ලැබුණේ දැයි දිවැසින් විමසා බලන විට දැක්කා ගිරිවිහාරවාසී චුල්ල පිණ්ඩපාතියතිස්ස තෙරුන් වහන්සේගේ කරුණා ගුණය නිසා තමාට අවසන් මොහොතේ දී කුසල් සිත් උපදවා ගැනීමට හැකි වුණ බව. තෙරුන් වහන්සේ මුණ ගැසී නමස්කාර කර එන්න ඕනෑ යැයි හිතා එවෙලෙම මනුෂ්‍ය ලොවට පැමිණ ගිරිවිහාරයේ තිස්ස තෙරුන් වහන්සේ සක්මන් කරන මළුව කෙළවර පෙනී සිටියා.

'ඔබ කවුද? කුමක් පිණිස මෙහි පැමිණියේද?'යි නාදුනන පුද්ගලයා දැක තෙරුන් වහන්සේ විමසා සිටියා. ඒ අවස්ථාවේ දිව්‍ය පුත්‍රයා සියලු පුවත් දන්වා 'ස්වාමිනි, ඒ අවස්ථාවේ දී මට පන්සිල් සමාදන්වීමට හැකියාව ලැබුණා නම් ලැබූ

දිව්‍ය සම්පත්වලට වඩා ඉහළ සම්පත් ලැබීමට භාග්‍ය උදා වෙනවා'යි පවසා සිටියා. ඒ අසා සිටි තෙරුන් වහන්සේ 'දරුව, එයට මම කුමක් කරන්නද? නුඹට ගැනීමට නො හැකි වුණා'යි පවසා සිටියා. දිව්‍ය පුත්‍රයා තෙරුන් වහන්සේට වන්දනා කර නැවතත් දෙව් ලොවට ගියා. තෙරුන් වහන්සේ බොහෝ කුසල් වැඩීම් කළා.

මේ කතා පුවත අංගුත්තර නිකාය අට්ඨකතාවේ තික නිපාතයේ දේව දූත වර්ගයේ සඳහන් වෙන්නේ.

මෙයින් අපට උගන්වන්නේ ධර්මය එක් පදයක් හෝ අසන්නට ලැබෙනවා නම් එයම පරලොව සේ ම මෙලොවත් බොහෝ සැප සම්පත් ලැබීමට හේතු වන බවයි. තෙරුන් වහන්සේගේ කරුණාව වැනි කරුණාවක් හැම හිතක ම පහළ වෙනවා නම් කොතරම් දුගතියකට පත්ව සිටියත් එයින් අත මිදීමට එම උදව් හේතු වන බව පෙන්වා දෙනවා. බෞද්ධයින් මේ ගුණ පුදුරු පුහුණු කර ගැනීම දෙලොව සැප පිණිස ම හේතුවන බව වැඩි දුරටත් මේ කතා පුවතින් පවසනවා.

> **"තෙරුන් වහන්සේ පුරා වසර පනහක් මට හැමදාම උදේ ම මුණ ගැසුණා. මම බත් හරලුවක්වත් දන් දුන්නේ නෑ. එහෙම කළ මා බලන්න උන්වහන්සේ අද වැඩම කර තියනවා. මම උන්වහන්සේට කළ උපකාරයක් නෑ. මගේ මොන ගුණයක් නිසාද උන්වහන්සේ වැඩම කළේ? "**



# ජාත්‍යන්තර භාෂා ඉගෙනීමෙන් බුදු දහම ලෝකයට දායාද කිරීමේ අවස්ථාව ලැබෙනවා



උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**ශ්‍රී ලංකා අමරපුර කල්‍යාණවංශ පාර්ශ්වයේ කොරියාවේ ප්‍රධාන සංඝනායක හබරාදූව කොක්වත්ත ශ්‍රී නිග්‍රෝධාරාමාධිපති හිටපු පරිවේණාධිපති ශාසන කීර්ති ශ්‍රී ශාස්ත්‍රවේදී**

**පූජ්‍ය අත්තරගොඩ පියනන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**


**ශ්‍රී ලංකා අමරපුර කල්‍යාණවංශ පාර්ශ්වයේ කොරියාවේ ප්‍රධාන සංඝ නායක ධුරය හොබවමින් කටයුතු කරන ඔබ වහන්සේ සසුන්බඹසර රැකීමට පෙළඹුණු මුල් අවධිය පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙනවා නම් නායක හාමුදුරුවනේ,**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට අයිති "අත්තරගොඩ" නමින් හඳුන්වන ස්වභාවික සෞන්දර්යයෙන් අනූන ඉතාම රමණීය ගැමි පරිසරයක තමයි මගේ ජන්මෝත්පත්තිය සිදුවුණේ. ඒ 1966 වර්ෂයේ ජූලි 11 වැනි දා. කළහේ ලොකුගේ නිකොළස් පියාණන් වගේම හිනිදුම ලියනගේ රූපාවතී මෑණියන් තුනුරුවන් කෙරෙහි බොහොම ශ්‍රද්ධාවෙන් කටයුතු කළ මව්පිය දෙපළක් නිසාම ඔවුන්ගේ ජීවිත තුළ තිබුණු ආදර්ශවත් බව මගේ ජීවිතයටත් ආශිර්වාදයක් වුණා. මගේ මෑණියන් මම පැවිදි වෙනවා දකින්න බොහොම කැමැත්තක් දැක්වූවා වගේ ම, පැවිදිවීමටත් උනන්දු කළා.

කළහේ ගැමුණු විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ගෙන, ගිංතොට මේධංකර මහා විද්‍යාලයෙන් ද්විතීක පාසල් අධ්‍යාපනය ලබමින් සිටි කාල පරිච්ඡේදයේ දී ම පැවිදිබිමට පත්වීමේ පුණ්‍යවන්ත අවස්ථාව උදාවුණා. ඒ අනුව ගාල්ල හබරාදූව කොක්වත්ත නිග්‍රෝධාරාමාධිපති අපවත්වී වදාළ පූජ්‍ය හරුමල්ගොඩ ධම්මානන්ද නායක මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ගාල්ල අත්තරගොඩ ශ්‍රී රත්නගිරි විහාරාධිපති විෂ වෛද්‍ය විශේෂඥ පූජ්‍ය ජුලම්පිටියේ ධම්මරක්ඛිත නායක හාමුදුරුවන් වහන්සේගේ ආශිර්වාදයෙන් අත්තරගොඩ පියනන්ද යන ශාසනික නාමයෙන් සම්මා සම්බුද්ධ ශාසනයේ උතුම් ප්‍රව්‍රජ්‍යා භාවයට පත්වුණා. 1980 වර්ෂයේ දෙසැම්බර් 04 වැනි දා ගාල්ල අත්තරගොඩ ශ්‍රී රත්නගිරි විහාරස්ථානයේ දී ඒඋතුම් පැවිදි පුණ්‍යෝත්සවය සිදුවුණ බවත් සිහිපත් කළ යුතුයි.

පැවිදිවීමෙන් අනතුරුව, ගෞරවනීය ගුරුදේවෝත්තම පාදයන් වහන්සේ යටතේ සාමණේර බණ දහම් වත් පිළිවෙත් හොඳින් ප්‍රගුණ කරගෙන උන්වහන්සේලාගේ මඟ පෙන්වීම යටතේ මූලික ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණ ලබා ගැනීම සඳහා අහංගම ධර්මෝදය පිරිවෙනට ඇතුළත් වුණා. එහිදී වසර 5ක් හොඳ ධර්ම අධ්‍යාපනයක් ලබාගෙන පිරිවෙන් විභාග සමත් වීමත් සමඟ වැඩිදුර ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණ කටයුතු වෙනුවෙන් කොළඹ ගංගොඩවිල ශ්‍රී සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙනට ඇතුළත් වුණා. සසුන් කෙත ආලෝකවත් කළ එම දීප්තිමත් පරිවේණාස්ථානවල වැඩ සිටි ධර්ම විනයධර අග්‍රගණ්‍ය වියත් පඬිවරුන් යටතේ සාර්ථක ලෙස පිරිවෙන් විභාග සමත්වීමෙන් අනතුරුව රත්මලාන පරමධම්මචේතිය පිරිවෙනට අනුබද්ධව පැවැති පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් දෑ අවුරුදු නැණ පිරිවෙන් ගුරු පුහුණුව ලබා ගත්තා.

ඒ වගේම මගේ උපසම්පදා පුණ්‍ය කර්මය සිදුවුණේත් පිරිවෙන් අධ්‍යාපනය ලැබූ කාලවකවානුවේදී ම යි. ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය දොඩම්පහළ චන්ද්‍රසිරි මහා නායක මාහිමිපාණන් වහන්සේ ඇතුළු ස්වනිකායික ගරුතර මහා සංඝ රත්නය වෙතින් අධිශීල සංඛ්‍යාත උපසම්පදා පුණ්‍යෝත්සවය කළපළුවාව ගෝතම තපෝවන මූලස්ථානයේ දී සිදුවුණු බවත් උන්වහන්සේලා වෙත ගෞරවයෙන් කෘතවේදීව සිහිපත් කළ යුතුයි. ඒ වගේම කොළඹ දේශීය ආයුර්වේද වෛද්‍ය මූලස්ථානයෙන් දේශීය වෛද්‍ය උපාධිය ලබා ගැනීමටත් කටයුතු කළා. ගමේ විහාරස්ථානයේ වැඩ සිටි ලොකු හාමුදුරුවන් වහන්සේ පන්සල ආයුර්වේද මධ්‍යස්ථානයක් බවටත් පත් කරගෙන කටයුතු කළ නිසා ම, උන්වහන්සේගෙන් ලැබුණු ආභාසය ආයුර්වේදය ඉගෙන ගැනීමට පෙළඹවීමක් ඇති කළා.




**ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනඟා ගැනීමට පසුබිම සකස් වුණ ආකාරය පැහැදිලි කරමින්ම ඔබ වහන්සේ සිදුකළ ජාතික, ආගමික, ශාසනික, සමාජීය සේවය කෙටියෙන් සඳහන් කරන්න අපේ හාමුදුරුවනේ,**

උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දකුණු කොරියාවට වැඩම කිරීමට සිදුවුණා. එහිදී Seoul National විශ්ව විද්‍යාලයෙන් වගේම (Seoul Konkuk) විශ්ව විද්‍යාලයෙන් කොරියන් භාෂාව හැදෑරීමට කටයුතු කළා. කොරියාවේ අති පෞරාණික විහාරස්ථානයක් වන කප්සා විහාරය, මාගොක්සා විහාරය යන ආයතන තුළින් මහායාන ධර්මය, වැඳුම් පිදුම් ක්‍රම, සංස්කෘතිය, භාවනා ක්‍රම අධ්‍යයනය කළා. ඒ වගේ ම වසර ගණනාවක් කොරියාවේ වැඩ සිටිමින් කොරියන් විහාරස්ථානවල ස්වාමීන් වහන්සේ සමඟ ඉතා සමීපව කටයුතු කරගෙන ගියා.

කොරියන් ශ්‍රී ලංකා බෞද්ධ පදනම හරහා ශ්‍රී ලංකා බෞද්ධ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ දරුවන් වරින්වර කොරියාවට කැඳවාගෙන ශ්‍රී ලාංකික සංස්කෘතික අනන්‍යතාව, වටිනාකම්, හර පද්ධතීන් කොරියන් ජාතිකයන්ට දැකබලා ගැනීමට අවස්ථාව ලබා දුන්නා. ශ්‍රී ලාංකික සංස්කෘතික වටිනාකම් පිළිබඳ ඔවුන් පුදුමයට පත් වුණා. ඒ වගේම ලංකාවේ ස්වාමීන් වහන්සේ වැඩමවා ගෙන වෙසක් පොහොය පින්කම්, කඨින පින්කම් පවා සිදුකරගෙන යාමට කටයුතු කළා.

2000 වර්ෂයේ සිට සෝල්විල් බුල්සා විහාරයේ ශ්‍රී ලංකා විහාරාධිපති වශයෙන් ලංකාවත්, කොරියාවත් අතර සමීප සබඳතාවක් ගොඩනඟා ගැනීමට කටයුතු කළා. කොරියන් රජයේ සහයෝගය මත හැපි සොසයිටි පදනම ආරම්භ කරමින් ඒ හරහා කොරියන් වෛද්‍ය කණ්ඩායම් ලංකාවට කැඳවාගෙන ලංකාවේ බොහෝ ස්ථානවල වෛද්‍ය සායන පැවැත්වීමට කටයුතු කළා. තවදුරටත් ඒ ආකාරයට එම සායන පවත්වා ගෙන යනවා. විදේශීය සහයෝගය මත හබරාදූව කොක්වත්ත නිග්‍රෝධාරාම විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කරමින් සියලු විහාරාරාංගයන්ගෙන් පරිපූර්ණ දර්ශනීය විහාරස්ථානයක් බවට පත්කර තිබෙනවා.

ගාල්ල ශ්‍රී ඤාණරතන පිරිවෙනේ පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් එම පිරිවෙන ගාලු ප්‍රදේශයට පමණක් නොවෙයි, ලංකාව පුරා ප්‍රසිද්ධ පිරිවෙනක් බවට පරිවර්තනය කළා. අවිවේකී බව නිසාම වර්තමානය වන විට පිරිවෙනින් ඉවත්වෙලා විහාරස්ථානයේ කටයුතු සිදුකරගෙන යනවා. ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් 2010 වර්ෂයේ දී ශ්‍රී කල්‍යාණවංශ දහම් පාසල ආරම්භ කළා. සියලුම දහම් පාසල් දරුවන්ට අවශ්‍ය පොත් පත්, ඇඳුම් පැළඳුම් වාර්ෂිකව නොමිලේ ලබා දෙනවා. වාර්ෂිකව ශිෂ්‍යත්ව පිරිනැමීමත් සිදු කරනවා. දහම් පාසල් දරුවන් සියලු දෙනා වෙනුවෙන් දෛනිකව ආහාර වේලක් ලබාදෙමින්, ජාත්‍යන්තර සම්බන්ධතා හරහා සුචරිතවත් දරු පරපුරක් ප්‍රදේශයට දායාද කිරීමට කටයුතු කරගෙන යනවා.


බුදු සසුනේ දියුණුව වෙනුවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ශාසනය වෙත දායාද කිරීමට කටයුතු කර තිබෙනවා. මේ වන විටත් මිර්යන් නගරයේ සාජොන්වොන් විහාරස්ථානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතවරයා වශයෙන් සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකර ගෙන යනවා.

1994 වර්ෂයේ සිට කොරියාවට වැඩම කරමින් පවත්වා ගෙන ගිය ජාත්‍යන්තර සම්බන්ධතා පදනම් කරගෙන සිදුකළ ශාසනික සේවය සම්භාවනාවට පාත්‍ර කරමින් අරමපුර මහා නිකායේ උත්තරීතර මහා නායක අග්ගමහා පණ්ඩිත අති පූජනීය දොඩම්පහළ චන්ද්‍රසිරි නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සංඝ සභාව විසින් කොරියාවේ ප්‍රධාන සංඝනායක ධුරය පිරිනැමීමට කටයුතු කළා.

**අත්දැකීම් පිරිපුන් යතීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් හැදෙන වැඩෙන පුංචි හාමුදුරුවන් වහන්සේට ඔබ වහන්සේගේ මඟ පෙන්වීම සිදුවන්නේ කුමන ආකාරයෙන් ද නායක හාමුදුරුවනේ?**

සිංහල, පාලි, සංස්කෘත භාෂාවන් වගේම ජාත්‍යන්තර භාෂා දැනුමත්, පරිගණක පුහුණුවත් ලබා ගැනීම වැදගත්. ජාත්‍යන්තර භාෂා ඉගෙග ගැනීමෙන් බුදුදහම ලෝකයට ම දායාද කිරීමේ අවස්ථාව ලැබෙනවා.

**හේමමාලා රන්දුනු**



දුටුගැමුණු මහ රජතුමා

90 කොටස

# යුද්ධ මණ්ඩල තීරණ ගැන ක්‍රිෂ්ණා කුමරියට සැකයක්

**ත්‍රිපිටක තිස්ස මහ තෙරුන් වහන්සේ සියල්ල බලා සිටියා මෙන් සත්‍ය ප්‍රකාශ කළ ආකාරය උපතිස්සගේ පුදුමයට හේතු විය. ඔහු නැඟිට ගොස් නැවතත් මාහිමිපාණන් වහන්සේගේ දෙපා නමැද බිම හිඳ ගත්තේ ය.**

"මාහිමිපාණන් වහන්ස, ඔබ වහන්සේ සියලු සත්‍ය ප්‍රකාශ කළ හැටි පුදුමයි. බොහෝ කාලයක සිට කලකිරීම් මැද සිටි මට, අප සිටිය යුතු පිල ගැන නිතර පෙන්වා දුන්නේ එළාර රජ කුමරියයි."

"හොඳයි, උපතිස්ස සෙනෙවිතුමනි, අද තොපගේ පලා ඒම සිදුවූයේ කුමන කරුණක් නිසාදැ"යි අපි මුලින් ම දැන ගන්නට කැමතියි.

"මහ තෙරුන් වහන්ස, විජිතපුර බලකොටුවේ සේනාංක භාරව සිටියේ මමයි. එහි සංවිධාන කටයුතු ගැන එළාර මහ රජතුමා බොහෝ පැහැදුණා. දීඝාභය මහ සෙනෙවිතුමා විජිතපුර බලකොටුවේ නායකත්වයට මා පත් කළේත් ඒ පැහැදීම නිසා යි.

"මේ අතර සිරිනාග නමින් සිටි උප සෙනෙවියෙක් මිත්‍ර මහ සෙනෙවිගේ උපාය මත චරපුරුෂයකු වශයෙන් මාගමට ගොස් දුටුගැමුණු රජතුමාගේ සේනාංකයට ඇතුළු වී රහස් ඔත්තු පරවියකු මඟින් එවන්නට පටන් ගත්තා. මේ නිසා එළාර රජු බොහෝ සතුටට පත්වුණා. ඔහු ආපසු ආවේ රහස් ඔත්තු ලබා ගැනීමට මාගම සෙනෙවිවරු හතර දෙනෙකුත් යොදාගෙන.

මිත්‍ර මහ සෙනෙවිගේ මරණයෙන් පසු මහ සෙනෙවි තනතුරට පත් මොහු මම මාගම රාජ්‍යයට ඔත්තු සපයන්නකු ලෙස පෙන්වා දෙන්නට නොයෙකුත් උපාය යෙදුවා. රජතුමා මේවා පිළිගත්තේ නැහැ. නමුත් දීඝජන්තු මහ සෙනෙවි පිළිගත්තා. එහි ප්‍රතිඵලය වුණේ තුණ්ඩිල නම් සෙනෙවියකු මහ සෙනෙවි තනතුරට උසස් කර විජිතපුර බලකොටුව ඔහුට භාර දීමයි."

"මෙවැනි සිදුවීම් නිසා මගේ කලකිරීම තවත් වැඩිවුණා. මේ නිසා දීඝාභය මහ සෙනෙවිතුමාටවත් නොකියා හොර රහසේ ම ආවේ රට ජාතිය ආගම වෙනුවෙන් උපරිම සේවය කරන්නයි."

"සිරිනාග, නුඹට මේ තරම්ම හතුරුකම් කළේ ඇයි? දෙදෙනා අතර විරසකකම් තිබුණාද"?

"නැහැ, මහා නාහිමියනි, ඔහුගේ දක්ෂකම් ගැන දීඝාභයගේත් මගේත් ලොකු පැහැදීමක් තිබුණා. දීඝජන්තු මහ සෙනෙවි ඔහුට විශේෂ වරප්‍රසාද ලබා දුන්නා. ප්‍රභූන් ඉදිරියේ අවස්ථා කිහිපයක දී ම රජතුමා ඔහුට සම්මාන පිරිනැමුවා. ඔහු ඒවාට කෑදරකමින් අපට අභූත චෝදනා එල්ල කරන්නට පටන් ගත්තා."

"දැන් සිරිනාග අනුරාධපුරයේ නැද්ද?" "ඔහු ඉතා කපටි පුද්ගලයෙක් රජතුමනි, මහවැලි ගං තීරයේ සටන් ආරම්භ වෙන විටම ඔහු දීර්ඝ නිවාඩුවක් ගෙන සියලු වගකීම්වලින් පැන ගියා."

එය ඇසූ සියල්ලෝම සිනහ නැඟූහ. සෑම දෙනාම සිනහ වෙන බව දුටු උපතිස්ස කෝපයට පත්විය.

"හොඳයි උපතිස්ස, සිරිනාග උත්සාහ කළේ තොප විජිතපුර බලකොටුවෙන් පන්නා දමා බලකොටුව තුළ අර්බුදයක් ඇති කරන්නට යැයි කීවොත් එය පිළිගන්නවාද?"

"ඔව්, දීඝාභය සෙනෙවිතුමා නැවතත් විජිතපුර බලකොටුවේ ප්‍රධානියා ලෙස පත් නොකොළොත් ලොකු ප්‍රශ්නයක් ඇතිවේවි."

"දීඝාභය, අපට මෙහි ගෙන්වා ගන්නට බැරිද?"

" බැහැ, මහ නාහිමියනි, ඔහු ගැමුණු රජතුමා කෙරෙහි දැඩි විරුද්ධ ආකල්පයක් දරනවා."

"අපි ඒ ගැන පසුව සාකච්ඡා කරමු. දැන් තොප දුටුගැමුණු රජතුමාගේ සේනාංකයට බැඳී රට, ජාතිය, ආගම බේරා ගැනීමේ සටනට අවංකම සහාය දෙන්නට කැමති ද?"

"එසේය, මහ නාහිමියනි, බොහෝ කාලයක සිට මගේ සිතේ පැවති ආශාවක්."

"මහා ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේලා ආපසු මාගම බලා වඩින්නට පෙර අපේ යුද මණ්ඩලය ඉදිරියේ උපතිස්ස මහ සෙනෙවියකු ලෙස පත්කර ඔහු අපට කළ සේවයට උපහාර දක්වන්නට කටයුතු කරන්න. ඒ සඳහා මෑණියන් වහන්සේගේ කැමැත්තත් ලැබේවි."

"සියල්ල සිදුවන්නේ හොඳටයි. උපතිස්ස අපට ලබා දුන්නාක් මෙන් තව නොබෝ දිනකින් දීඝාභය ද අපේ කඳවුරට ගෙන්වා ගන්නට සිරිනාගට හැකි වේවි."

මහාසිව මාහිමිපාණන් වහන්සේගේ ප්‍රකාශයෙන් උපතිස්ස පුදුමයට පත්විය.

"මහරජතුමනි, හෙට සවස් වරුවේ මහසෙනෙවි තනතුරු ප්‍රදානය කිරීමේ උත්සවය පැවැත්වෙනවා. එතෙක් උපතිස්ස සෙනෙවිට අප සමඟ රැඳී සිටීමට ඉඩ දෙන්න. අපට ඔහුගෙන් බොහෝ දේ දැනගන්නට හැකි වේවි. ඉදිරි සැලසුම් සකස් කිරීම සඳහා දාව ආචාර්යතුමාට ඒ කරුණු බොහෝ වැදගත් වේවි."

පසුදා හිමිදිරියේ එළාර රජුගේ දියණිය, ක්‍රිෂ්ණා කුමරිය හමුවීමට තුණ්ඩිල පැමිණියේ ය. යුද කටයුතු ගැන සාකච්ඡා කිරීම ඔහුගේ අරමුණ විය.

"තුණ්ඩිල මේ රටේ මිනිස්සුන්ට යුද්ධයක් අවශ්‍ය නැහැ. ගොවිතැන් කටයුතු කරගෙන සාමයෙන් සහයෝගයෙන් ජීවත් වන්නට තිබෙනවා නම් ඒ ඇති. තමන් ළඟට එපා කාට වුණත් ඒ අය සුහදයි. උපකාර කරනවා.

තුණ්ඩිල, අපි ඒ සිංහලයන්ගේ සංස්කෘතිය විනාශ කරලා, ඉතිහාසය වෙනස් කරලා. මනුස්සකම නොසලකා හැරලා. හැදිච්චකම බාල්දුවට පත්කරලා. ඒ විතරක් නොවෙයි,

අපේ නායකයන් මේ රට සූරාගෙන කනවා. ගම්මාන කොල්ලකනවා. පන්සල් විනාශ කරනවා. රන්, රිදී, මුතු, මැණික් නැව් පිටින් තමන්ගේ රටට පටවනවා. මගේ පිය රජතුමා මිනිසුන් ජීවත් කරවන්න හදනවා. අනෙක් සියලු දෙනාම මිනිසුන්ට විපත් පමුණුවනවා."

"යුද්ධය කියන්නේ සාමය නොවෙයි කුමරිය, යුද්ධයේ දී කරුණාවක්, දයාවක් නැහැ. අපි තුන් මාසයක් ඇතුළත දුටුගැමුණු රජතුමාගේ සේනාංක සියල්ල සමූල ඝාතනය කර අපේ රාජ්‍ය රැක ගන්නවා."

"තුණ්ඩිල, මේ අපේ රාජ්‍යයක් නොවෙයි. මේක සිංහලයන්ගේ රජ රට. මෙය දුටුගැමුණු රජතුමාට පාරම්පරිකව අයිති රාජ්‍යය. ඔවුන්ගේ අයිතිය ලබා ගන්නයි ඒ අය එන්නේ."

"ඒක කවදාවත් සිදුවන්නේ නැහැ කුමරිය. අපේ තිත්ථම්භ සෙනෙවියාගෙන් ඔවුන් දැනටමත් පාඩම් ඉගෙන ගෙන ඇති. දීඝජන්තු මහ සෙනෙවිතුමා අපේ විසි මහ යෝධයන් ඔවුන්ගේ සේනාංකත් සමඟ යැව්වේ ගැමුණු සේනාංක නවත්වන්නයි."

"සිරිනාග මහ සෙනෙවිතුමා, හී පතකින් පියරජුට දන්වා එවා තිබුණේ දකුණු කඳවුර ඉවත් කරගෙන, ඇතුළත කඳවුරු ආරක්ෂා කරගන්න කියලා. කාගෙද ඔය මෝඩ තීරණය."?

"යුද්ධ මණ්ඩලයේ"

"මහ රජතුමා, එය අනුමත කළා ද?"

නැහැ, එම යුද්ධ මණ්ඩල රැස්වීමට රජතුමා පැමිණියේ නැහැ. තීරණ ගන්නේ මහ සෙනෙවිතුමා විසිනුයි. විජිතපුර බලකොටුව මගේ අණසක යටතේ තිබිය යුතු බවත්, යුද්ධ මණ්ඩලය තීරණය කළා. විජිතපුර බලකොටුවේ මහ සෙන්පති මම."

"එහෙමනම්, දීඝාභය මහ සෙනෙවිද?"

"ඔහු කාර්ය නියමයක් නැති මහ සෙනෙවි."

"පියරජතුමා ඔය මෝඩ තීරණ ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ නැහැ."

"මහ රජතුමා යුද්ධ මණ්ඩල තීරණ වෙනස් කරන්නේ නැහැ."

එළාර දියණියට ඇති වූයේ සැකයකි. පිය රජතුමාගේ අවසරයකින් තොරව මෙවැනි මෝඩ තීරණවලට එළැඹීමට මොවුන්ට බලයක් කොයින්ද?"

"තුණ්ඩිල, තොප තවමත් මහවැලි ගං තොටමුණු භාර මහ සෙනෙවි. එහි කටයුතුවලින් බැහැරව මෙහි කරන්නේ කුමක්ද?"

***ඉතිරි කොටස උඳුවප් අමාවක පෝදු (23) අන්තර්ජාල කලාපයේ පළවේ***

**අයන්ති විතාන**